# භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් අනුගමනය කළ භාෂා ප්‍රයෝග පිළිබඳ විමර්ශනයක්

ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් තම ග්‍රන්ථ විලාසයත්, පාඨක පිරිසත්, වස්තු විෂයත්, ග්‍රන්ථ කරණයේ අපේක්ෂාවත්, සිහියේ තබා ගනිමින් තම ග්‍රන්ථයනට අභිමත භාෂා ප්‍රයෝගයන් සුදුසු අයුරෙන් සුදුසු තැන්හි යොදා ගෙන ඇත. විග්‍රහාත්මක රීතියෙන් පිරිපුන් බසක ප්‍රයෝග ධර්මප්‍රදීපිකාවෙන් දත හැකි ය. අමාවතුරෙහි භාෂාව ධර්මප්‍රදීපිකාවේ තරම් කඨෝර නො වූ ශිථිල බවෙන් යුක්ත ය. නව අරහාදී බුදු ගුණ පිළිබඳ සීමාවක් නො පා වැනීමෙහි උත්සුක වූ විද්‍යාචක්‍රවර්ති ඒ සඳහා ඇවැසි භාෂා ප්‍රයෝග යොදා ගනිමින් බුත්සරණ ලියුවේ ය.

ගුරුළුගෝමීන් දෙ මගක අර්ථ සාධනය උදෙසා ධර්මප්‍රදීපිකාවත් අමාවතුරත් ලිවීය. බුද්ධ චරිත කථාව ලිවීම අමාවතුරට පාදක කර ගත් කතුවරයා පාලියෙන් ලත් ආභාසය ඇත්තේ හෙළයෙහි මුලදී ම හමුවන ශිලා ලේඛකයකුගේ භාෂාවත්, අටුවා කථාකාරයකුගේ භාෂාවත් සිහිපත් කරවන්නේ යැයි ඇතැම් විචාරකයෙක් පෙන්වා දෙති. ධර්මප්‍රදීපිකාව කෙසේ වෙතත් අමාවතුර බිඳගත් ශබ්ද සිංහල ලේඛනයට හුරු කරවීමෙහි ලා අත්පොත වූයේ යැයි පැවසුව ද එහි අතිශයෝක්තියක් නැත.

අමාවතුරෙන් ආරම්භ ව සිංහල ලේඛනය පෝෂණය කළ බසක අසිරිය බුත්සරණින් දැක ගත හැකි ය. ව්‍යක්ත විශාරද භාෂා නෛපුණ්‍යතා ව මෙන් ම සාමාන්‍ය ජනතාව උදෙසා අසා රස විඳීමට පොහොනා බසක් බුත්සරණින් දක ගැනීමට පුළුවන. සාමාන්‍ය ජනතාවගේ ශ්‍රද්ධා බුද්ධි වර්ධනයෙහිලා උපකාරි වන භාෂාවක් විද්‍යාචක්‍රවර්තීන් යොදා ගත්ත ද ඇතැම් දහම් කොටස් විස්තර කෙරෙන තැන කතුවරයාගේ විශද භාෂා ඥානය ප්‍රකට කෙරෙන වර්ණනා ද නැත්තේ නො වේ. සිංහල ගද්‍ය රචනා මාර්ගය ශ්‍රව්‍ය හා ශ්‍රවණීය යැයි දෙ මගෙක් වුයේ ද කතුවරුන් තම වස්තු විෂය හා පාඨක පිරිස උදෙසා සකසා ගත් භාෂාව නිසාවෙනි.

> "අනෙකකු කියවනු ඇසීමෙන් අර්ථ රසය විඳුනා ග්‍රන්ථ ශ්‍රව්‍යයෝ ය. කියවනු ඇසීමෙන් එක්වට මැ ශබ්ද රසය හා අර්ථ රසයත් වින්ද හැකි ග්‍රන්ථයෝ ශ්‍රවණීයෝ යි ........ ප්‍රථම ගණයෙහි අමාවතුර, ධර්මප්‍රදීපිකා, බුත්සරණ, සද්ධර්මරත්නාවලී ආදි ග්‍රන්ථයෝ ය."[1]

ගුරුළුගෝමීන්ගේ හා විද්‍යාචක්‍රවර්තීන්ගේ ග්‍රන්ථ පරමාර්ථයෙහි ලා භාෂාව යොදා ගත් ආකාරය පිළිබඳ ව පශ්චාත් කාලීන විචාරකයෝ විවිධ අදහස් හා මත පළ කරති. ඔවුනගේ මත කවරාකාර වුවද කතුවරුන් දෙදෙනා ම උත්සාහ දරා ඇත්තේ තම රචනා මාර්ගයෙන් පාඨක ජනතාව තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධා භක්ති වර්ධනය කරවීමයි. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ හා ප්‍රස්තුත ග්‍රන්ථ රචිත අවධිය වන විට සමාජයේ මුල් බැස ගෙන තිබූ භාෂාත්මක ප්‍රවණතාවන් ද උපයෝගි කර ගෙන කතුවරුන් දෙදෙනා ම තම අභිමත ඉලක්ක සපුරා ගැනීමට

සමත් වී ඇත. ගුරුළුගෝමීන්ගේ භාෂා ප්‍රයෝගයන් පිළිබඳ ව මහාචාර්ය ආනන්ද කුලසූරිය මහතා මෙසේ අවධාරණය කරයි.

"පෙළ අටුවා හෙළ බසට පෙරළීමෙහි ගුරුළුගෝමී පඬිතුමන් ගත් මග පිළිබඳ කරුණු කීපයක් යථෝක්ත විස්තරයෙන් මතු වේ. එය මෙසේ දැක්විය හැකි ය.

I ගුරුළුගෝමීහු පෙළ අටුවාවෙහි නිවැරිදි අර්ථය හෙළ බසින් දෙති .......එය වචනාර්ථයෙන් ද ගැප් වූ රසයෙන් ද අනූන වේ.

II ඇතැම් තැනෙක පාලි කතාව හකුළුවා දක්වති. අන් තැනක එය විස්තර සහිත ව ලියා ඇත්තේ ය. කවර මගක් ගත්ත ද කතා රසයට හානියක් නො වන සේ රචනාව කොට ඇත.

III පාලි කතා වස්තුවක් ඇසුරු කොට එය ම පදනම් කොට ගුරුළුගෝමීන් ස්වකීය කතාව ලියුව ද පාලිය ඇතු ව හෝ නැතු ව සිංහල කතාව අගනා රචනයක් වන්නේ ය.

ගුරුළුගෝමීන්ගේ අමාවතුරට පෙර සිංහල ගද්‍ය කතා ලිවීමට යෝග්‍ය වූ ලේඛන මාධ්‍යයක් සුදුසු වශයෙන් පැවැති බවක් සාහිත්‍යයෙන් නො පෙනේ. වෙසෙසින් බුද්ධ චරිතයට සුපුරුදු පරිදි සිංහල ගද්‍ය සකස් කොට ගන්නා ලද්දේ එතුමන් විසිනි."[2]

බුද්ධ ධර්මයත්, බුද්ධ චරිතයත් වර්ණනාවට බට ගුරුළුගෝමීන් පාලියත් සංස්කෘතයත් ඇසුරු කර ගනිමින් තම ග්‍රන්ථ විෂයට සුදුසු වන අයුරෙන් පාඨක හා ශ්‍රෝතෘ ජනයා අතර ශ්‍රද්ධා භක්ති ජනනයට උත්සුක වූ අයුරු එමගින් ධ්වනිත ය. සියලු බුදු ගුණයන් ම වර්ණනා කරන විද්‍යාචක්‍රවර්තීන් ගුරුළුගෝමීන්ගේ භාෂාව ද ආශ්‍රිත කර ගනිමින් බුත්සරණෙහි භාෂා ප්‍රයෝගයන් යොදා ගෙන ඇත. ශ්‍රව්‍ය කාව්‍යයකට සරිලන පරිදි පෙළත් සකුවත් හෙළයට නගා ගෙන ඇත.

" බුත්සරණ ගද්‍ය කාව්‍ය ස්වරූපයක් උසුල යි. කාව්‍ය ගණයෙහි ලා සැලකිය හැකි ගද්‍යයෙන් ලියවුණු ඕනෑ ම රචනයක් ගද්‍ය කාව්‍යයක් වශයෙන් ගිණිය හැකි වුව ද බුත්සරණ සිංහලයේ අන්‍ය ගද්‍ය කාව්‍යයන්ගෙන් වෙන් කරන ලක්ෂණ ද වේ. ගද්‍යයෙන් ලියන ලද වුව ද වෘත්තයකට අයත් ලක්ෂණය එහි ඇත.සාමාන්‍යයෙන් පද්‍ය පිළිබඳ සැලකෙන වෘත්තය බුත්සරණෙහි ඇතැම් තැනෙක බලපා ඇති අයුරු ග්‍රන්ථය කියවීමෙන් පෙනී යන කරුණකි. කුඩා රළ කීපයක් එක් වීමෙන් විශාල තරංගයක් ඇති වන්නා සේ කෙටි වාක්‍ය ඛණ්ඩ කීපයක් එක පිට එක පැටවීමෙන් දීර්ඝ වාක්‍යයක් ඇති වේ. එබඳු දීර්ඝ වාක්‍ය මේ ගද්‍ය රීතියේ විශේෂ ලක්ෂණයකි."[3]

ඉහත දක් වූ කරුණු දෙස බලන කල්හි මහාබෝධිවංශ පරිකථාවේත්, පුරිස දම්මසාරථි පද වර්ණනාවේත්, අමෘතාවහ කෘතියේත් භාෂාවෙහි සුවිශේෂීතාවන් හඳුනා ගැනීමට පුළුවන. වස්තු විෂය විවිධ වුව ද එමගින් කතුවරයන් දෙදෙනා ම පාඨක ශෝතෘ ජනතාවගේ ළෙහි ශ්‍රද්ධා භක්තිය ජනිත කරවීම් වස් යොදා ගත් භාෂා ප්‍රයෝගයන් මෙහිදී හඳුනා ගත හැකි ය. ඒ අතර ප්‍රමුඛතාව දී හඳුනාගත හැකි ලක්ෂණත්‍රයකි.

I විග්‍රහාත්මක භාෂා භාවිතය.

II ආඛ්‍යානමය භාෂා භාවිතය.

III කාව්‍යාත්මක භාෂා භාවිතය. වශයෙනි.

## විග්‍රහාත්මක භාෂා භාවිතය

විග්‍රහාත්මක රීතියේ දක්නට ලැබෙන විශේෂතම භාෂා ප්‍රයෝගයන් කීපයකි. ඒ වචන විග්‍රහ කිරීම, නිරුක්ති අර්ථ දක්වීම, අලංකාර ගෙන හැර දැක්වීම, විවිධාර්ථයෙන් පද විස්තර කිරීම හා පදයන්ගේ ව්‍යාකරණ විභාග දක්වීම ආදි ප්‍රයෝගයන් ය. කතුවරයන් දෙදෙනා ම තම ග්‍රන්ථයන්හි භාෂා ප්‍රයෝග අතරට විග්‍රහාත්මක රීතිය ද සම සමසේ යොදා ගෙන ඇති බව තත් ප්‍රස්තුත ග්‍රන්ථ පරිශීලනයෙන් අවබෝධ කර ගැනීමට පුළුවන.

විශේෂයෙන් ම වචනයක හාත්පස අරුත් දන වෙන තැන, වචනයක නිරුක්ති මෙන් ම ව්‍යාකරණ විස්තර විභාග දක්වෙන තැනෙක්හි දි ධර්මප්‍රදීපිකාවෙන් දක්වෙන්නේ මෙම විග්‍රහාත්මක භාෂා ලක්ෂණය යි. සංස්කෘත මිශ්‍ර තත්සම වදන් බහුල කොට යොදා ගත් එම භාෂාව ශිථිල නො වේ. ඇතැම් පදයනට හාත්පස අරුත් දනවන කතුවරයා කයෝර වූ භාෂාවක් ම යොදාගෙන ඇත. ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේදි යොදා ගත් තත් විග්‍රහාත්මක භාෂා ප්‍රයෝගය පිළිබඳ ව පශ්චාත් කාලීන විචාරකයන්ගේ විවිධ අදහස් ද මෙහි දි වැදගත් වනු ඇත.

> "සිංහලයෙහි සුලභ නො වූ සංස්කෘත වචනයෙන් ගහණ වූ කයෝර භාෂාවෙන් ලියන ලද මේ ප්‍රකරණයෙන් ගුරුළුගෝමීන්ගේ විශාරද ග්‍රන්ථ ඥානය ප්‍රකාශ වේ. ධර්මප්‍රදීපිකාව සද්ධර්මය පිළිබඳ කෝෂ ග්‍රන්ථයක් වැන්න. එසේ වුව ද අශිථිල භාෂාව නිසා එය සාමාන්‍ය ජනකායට අත නො ගැසිය හැකි ග්‍රන්ථයක් විය."[4]

ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේදි යොදා ගත් වර්ණනාවන් හා සම්බන්ධ සියලු භාෂා ප්‍රයෝග රීති පිළිබඳ ව මෙම විග්‍රහයෙන් ධ්වනිත නො වේ. හුදෙක් ම එම විග්‍රහය විග්‍රහාත්මක රීතිය පිළිබඳ ව යි. පරිකතා ග්‍රන්ථයකින් මෙන් ම විග්‍රහාත්මක රීතියකින් අපට බලාපොරොත්තු විය හැක්කේ ද අලංකාරයෙන් භූෂණය කොට, වර්ණනයෙන් හරවත් කොට යෙදූ භාෂාවක් නො වේ. බුදුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය විස්තර කරන කෝෂ ග්‍රන්ථයක් බඳු ධර්මප්‍රදීපිකාවෙන් කතුවරයාගේ දේශජ භාෂා ඥානය මෙන් ම දේශාන්තර භාෂා ඥානය ද විශද කරව යි. මහායානය පිළිබඳවත් ථෙරවාදය පිළිබඳවත් හසල දැනුමක් තිබූ ගුරුළුගෝමීන් සංස්කෘතය මෙන් ම පාලිය ද තම

වර්ණනාව සඳහා යොදා ගත්තේ ය. එබැවින් එම භාෂාව කයෝර විය හැකි ය. සාමාන්‍ය ජනයාට දුරවබෝධ විය හැකි ය. එය විග්‍රහාත්මක රීතියේ ප්‍රධාන ලක්ෂණය යි.

> ''භාෂාව ගැන සලකන කල්හි ධර්මප්‍රදීපිකාවෙන් කරුණු කීපයක් අනාවරණය වේ. ගුරුළුගෝමීහු අවස්ථාවට උචිත භාෂා ව්‍යවහාරය යොදා ගනිති. අර්ථ ව්‍යාඛ්‍යානයෙහි ද පරිකතා කිරීමෙහි ද ඔහු සංස්කෘත මිශ්‍ර භාෂා රීතිය උපයෝගී කොට ගනිති........ පරිකතා සපයන කල්හි දේශාන්තර භාෂා ඥානයෙන් ද බහුශ්‍රත භාවයෙන් ද ගත් කරුවාගේ භාෂා රීතිය පෝෂණය වී ඇත....... පොළොන්නරු යුගයෙහි සිංහල ගද්‍ය භාෂාවට එක් වුණු තත්සම පද බහුල මිශ්‍ර සිංහල රීතිය මෙම ග්‍රන්ථයෙන් මනා සේ හෙළි වේ.''[5]

පරිකතා සැපයීමේ දි මෙන් ම අර්ථ ව්‍යාඛ්‍යානයේ දි ගුරුළුගෝමීන් සංස්කෘත මිශ්‍ර භාෂා රීතියක් යොදා ගත්තේ ය. තත්කාලීන යුගයේ උගතුන් විසින් සම්භාවිත සංස්කෘත භාෂාව වැඩි වැඩියෙන් තම ග්‍රන්ථය තුළට වැද්ද ගැනීමෙන් කතුවරයා තම බහුශ්‍රැත බවත් විශාරද දැනුමත් ප්‍රකට කරව යි. ආඛ්‍යාන රීතියටත් කාව්‍යමය රීතියටත් වඩා කතුවරයාට ඒ සඳහා උපස්ථම්භක වූයේ විග්‍රහාත්මක භාෂා රීති ප්‍රයෝගය යි. ධර්මය පිළිබඳ විස්තර කිරීමත්, පරිකතා ග්‍රන්ථයක් වීමත් යන දෙ මගෙන් ම කතුවරයාට මෙහිදි ප්‍රයෝජනවත් වී ඇත්තේ විග්‍රහාත්මක රීතිය යි.

ඉතා ගැඹුරු දහම් කොටස් විස්තර කිරීම ගුරුළුගෝමීගේ පරමාර්ථය වූ හෙයින් ඒ සඳහා උපයෝගි කර ගෙන ඇත්තේ ද සංස්කෘත මිශ්‍ර ගැඹුරු බසෙකි.

ධර්ම කොටස් වර්ණනා කළ යුතු තැනෙක්හි දි එම රීතිය ගුරු කොට ගත්ත ද සංවර්ණනාවලදි එවැන්නකට ම සීමා නො වූ බව පෙනේ. කෙසේ වතුදු ගැඹුරු දහම් කොටස් විස්තර කරන ගුරුළුගෝමීන් විග්‍රහාත්මක රීතියේ භාෂා ප්‍රයෝගයන් යොදා ගත් අයුරු නිදසුන් කීපයක් ගෙන විමසීම වටී.

> ''එහි අරහත් නම් කවරැ යත්? ආරාද් හතත්වාදර්හත් අරීණං හතත්වාදර්හන්, අරාණාකුව හතත්වාදර්හන්, ප්‍රත්‍යයාදීතාමර්හතත්වාදර්හන්, පාපකරණෙ, රහොභාවාදර්හන් යන මේ පස් අර්ථයෙන් අර්හත් නාම් වේ. එහි ආරාද් හතත්වාදර්හන් යන තන්හි හන්තිහු ගතියහු පයීත වන බැවින් තථාගත සර්ව ක්ලේශයන් කෙරෙන් ආරද් ගත යැ. අතිදූරයෙහි ස්ථිත යැ. මාර්ග ඥානයෙන් ස්වාසන කෙලේශයන් විධ්වංසනය කෙළේයැ, යන අර්ථ යි.''[6]

විග්‍රහාත්මක රීතියේ දක්නට ලැබෙන වචන විග්‍රහ කිරීම හා නිරුක්ති අර්ථ දැක්වීම මෙයින් පෙනේ. ''එහි අර්හත් නම්'' යන පදයට පරිකතා සපයන ගුරුළුගෝමීන් පාලි ගාථා පාඨ හයක් සමග මුද්‍රිත පිටු දෙකක් ඒ සඳහා මිඩංගු කොට ඇත. මෙවැනි වර්ණනා මාර්ගයකින් සාමාන්‍ය ජනයාගේ ශ්‍රද්ධා බුද්ධි වර්ධනයක් බලාපොරොත්තු විය නො හැකි ය. එහෙත් ප්‍රාඥයන්ගේ දැනුම් වර්ධනයටත්,

කතුවරයාගේ බහුශ්‍රැත බව ප්‍රකට කරවීමටත් මේ බස පොහොනා වේ. තවද "ලඞකාවාසීනමත්ථාය" යන තන්හි පද විභාග මෙන් ම වියරණ විභාග කරන්නේ මෙසේ ය.

> "යන තන්හි සත්වයනුයෙහි වැටෙයි, 'සත්වයනු' නම් ද්‍රව්‍ය ශරීරයැ. ද්‍රව්‍ය ශරීරයේ ප්‍රතිෂ්ඨිතා යූ සේයි. බහුව තාසාම් ප්‍රතිමණසතානාං රාජා සහිෂ්ණුස්ත්‍රිදශාධිපාථි යන තන්හි සාදෘශෘයෙහි වැටෙයි. ත්‍රිදශාධිපාර්ථ යනු ත්‍රිදශාධිපසදෘශ යූ සේයි. එයින් කීහ."[7]

මෙවැනි වර්ණනා පද විග්‍රහයක් තුළ දක්නට ලැබෙන්නේ නම් එය විශ්ලේෂණාත්මක හෙවත් විග්‍රහාත්මක භාෂා ප්‍රයෝගය යි. තත්සම වදන් බහුල කොට ඇති එම රීතියේ විශේෂ ලක්ෂණ කීපයක් ගුරුළුගෝමීන් යොදා ගෙන ඇත.

එනම්,

I සකු වදන් බහුල ශෛලිය.

II හෙළ වදන් හා සකු වදන් මිශ්‍ර ශෛලිය.

III හෙළ වදන් හා පෙළ වදන් සහිත ශෛලිය.

IV හෙළ වදන් බහුල ශෛලිය වශයෙනි.

ධර්මප්‍රදීපිකාවේ දක්නා ලැබෙන මෙම විශ්ලේෂණාත්මක රීතිය ගාඪ අශිථිල රීතියක් ලෙසින් ඇතමෙක් හඳුන්වන්නෝ ද මෙම භාෂා ප්‍රයෝග බැවිනි. ග්‍රන්ථ කරණයේ විෂය ය හා වස්තු විෂය සලකන කල්හි එවැනි රීතියක් ගුරු කොට ගැනීම පුදුමයට කරුණක් ද නො වේ.

අමාවතුර බුදුන් වහන්සේගේ චරිත කතාවේ එක් සුවිශේෂී ගුණයක් වර්ණනා කෙරෙන බැවින් ධර්මප්‍රදීපිකාවේ මෙන් පද විභාග, ව්‍යාකරණ විභාග, නිරුක්ති විභාගාදිය දක්නට නැත. එහෙත් සකු වදන් බහුල ශෛලිය, පෙළ වදන් බහුල ශෛලිය හා සකු හා හෙළ වදන් බහුල ශෛලිය යොදා ගනිමින් විග්‍රහාත්මක රීතිය අනුගමනය කළ තැන් ද දැක ගැනීමට පුළුවන. එවැනි තැන් දක්නට ලැබෙන්නේ ද සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ධර්මය විමසන තැනෙක්හි දී ය.

අමාවතුර කතුවරයාගේ භාෂාව පිළිබඳ ඉදිරිපත් වී ඇති විචාරක අදහස් අතර විග්‍රහාත්මක රීතිය පිළිබඳ කෙරෙන ඉඟිකිරීම් දක්නට පුළුවන.

> "ගුරුළුගෝමි පඬිතුමා අමාවතුර බස සකස් කර ගත්තේ පාලි පද එකක් පාසා ගෙන ඒ එක එකට සිංහලෙන් අර්ථ දීමෙනි. සිංහල සන්න අටුවා ගැටපද පොත් කර්තෘන් වරෙක පෙළ පොත ද වරෙක අටුවා පොත ද බලාගෙන පාලි පාඨයන්ට සිංහලෙන් අරුත් දැක්වූවා සේ ම ගුරුළුගෝමී ද අමාවතුර ලියුවේ ය."[8]

සන්න හා අටුවාකරුවන්ගේ විශේෂ ලක්ෂණය වන්නේ තමන් තෝරා ගත් පදවල විස්තරාර්ථ දැක්වීම යි. විටෙක එහිදි වර්ණනාත්මක රීතිය දක්නට ලැබෙයි. එහෙත් අමාවතුර කතුවරයා කිසි

විටෙකත් අනවශ්‍ය එකදු වචනයක්වත් නො යොදා තම භාෂා රීතිය ද සැකෙවින් සකසා ගත්තේය. භාෂා ප්‍රයෝගය සැකෙවින් වුව ද එයින් ධ්වනිත කරන්නා වූ ශබ්දාර්ථ රසය කිසි විටෙකත් සැකෙවි ශෛලියක් නො වීය.

පාලියත්, සංස්කෘතයත් සමයාන්තර ග්‍රන්ථයනුත් මනා ව අවබෝධ කර ගත් ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේ තරම් අමාවතුරට විග්‍රහාත්මක රීතිය යොදා ගෙන නැත. චරිත කතාවට මුල් තැන දෙන එයිනුත් පුරිසදම්මසාරථී ගුණය ඉස්මතු කෙරෙන වස්තු විෂයක් තුළින් විග්‍රහාත්මක භාෂා ශෛලියක් බලාපොරොත්තු වන්නේ නම් එය සුදුසු නැත. එවැනි අවස්ථාවලදි ගැඹුරු මාතෘකා ඔස්සේ කෙරෙණු සම්මුඛ සාකච්ඡාවන් ඉදිරිපත් කිරීමේ දි ගුරුළුගෝමීන් අමාවතුරට විග්‍රහාත්මක රීතිය යොදා ගෙන ඇති අයුරක් දැකීමට පුළුවන. පහත සඳහන් උද්ධෘත ඒ සඳහා නිදසුන් ය.

> ''එසෙයින් ම මම මහණ ගොයුම්හු හා වාදයෙන් වාද කොට කථා මාර්ගයෙන් දොස් දක්වා ඔබට මොබට ලා ආකර්ෂණ පරිකර්ෂණ, සම්පරිකර්ෂණ කෙරෙමි........ වාදයෙන් වාදකොට අවධුනන, නිර්ධුනන නිස්ඵොටන කෙරෙමි.''[9]

මානවක දමන කතාවේ එන මෙම ප්‍රකාශය ප්‍රකෘති භාෂණයෙන් ඉදිරිපත් කොට ඇත. සච්චකයා බුදුන් වහන්සේ හා වාද කොට බුදුන් වහන්සේ දුර්මුඛ කරමි'යි යන සිතැති ව කෙරෙන මෙම ප්‍රකාශයේ සකු වදන් බහුල හෙළ වදන් මුසුවක් දැක ගැනීමට පුළුවන.

තත්සම වදන් බහුල මෙම වර්ණනා රීතියෙන් කතුවරයාගේ විශාරද ඥානය ප්‍රකට කෙරෙනවා විනා සාමාන්‍ය ජනතාවගේ ශ්‍රද්ධා භක්ති වර්ධනයෙහිලා එතරම් ප්‍රයෝජනවත් නො වේ. මානවක දමන කතාවේදී ම සච්චකයා බුදුන් වහන්සේගෙන් රහත් යනු කවරෙක් දැයි විමසූ කල්හි බුදුන් වහන්සේගේ මුවට නගමින් ඉදිරිපත් කෙරෙන ප්‍රකෘති භාෂණය විග්‍රහාත්මක රීතිය ඔප් නංවන්නකි.

> ''ගිනි වෙස්න මේ සස්නෙහි මහණෙක්, 'යං කිඤ්චිරූපං අතීතානාගතප්පච්චු පන්නං -ප- න මෙසො අත්තා' යන එකොළොස් වැදෑරුම් හැම රූප මා නො ගත්තේයැ. මම රූපයෙන් නො වෙමි. මාගේ ඉසුරු රූපයෙහි පවත්නේ නො වෙයි මෙසේ යථාභූතය නුවණින් දක අනුපාදා විමොක්ෂයෙන් විමුක්ත වී ද එසේයින් ම 'යා කාචිවේදනායා කාචි සඤ්ඤා......' යන එකොළොස් වැදෑරුම් හැම විඥාන මා නො ගත්තේ යැ. මෙසේ යථාභූත අර්ථය නුවණින් දැක අනුපාදාවිමොක්ෂයෙන් විමුක්ත වී ද මහණ, මෙ පමණෙකින් ''රහත්''නම් වෙයි''[10]

රහත් යන වචනයේ පරිසමාප්ත අර්ථය ම ධ්වනිත වන අයුරෙන් කරන මෙම විස්තරය සන්න අටුවා කරුවකුගේ වර්ණනාවකට සමාන ය. හාත්පස වචනාර්ථය ම ඉදිරිපත් කොට ඇත. එය විග්‍රහාත්මක රීති ලක්ෂණය යි.

තවද අමාවතුරෙ පළමු වන පරිච්ඡේදය දූර්දාන්ත දමන කතාව යි. ග්‍රන්ථය පුරාවට නගන ලද පූර්විකාවක් වැනි වූ එම පරිච්ඡේදය පුරා දක්නට ලැබෙන්නේ විග්‍රහාත්මක රීතියේ ලක්ෂණ ය. විස්තර වර්ණනා හා කාව්‍යාත්මක වර්ණනා එහි ඇතුළත් ව නැත. ජාතක කතා 205 ක් පමණ නාමික ව දක්වමින් ලියූ එම පරිච්ඡේදය අවසන් කරන්නේ දේශාන්තර භාෂා ඥානය ද ප්‍රකට කරවමිනි.

> ''මෙසේ තමන් බෝසත් කල්හි මැ පුරිසදම්මසාරථී වන බැවින් නො එක් දෑ කෙළ සුවහස්හි දූර්දාන්ත සත්වයන් දමා ශීල සමාධි ප්‍රඥා ලක්ෂණ ගුණ ධර්මයන් පිරියෙස්මින් සතතාභ්‍යාස, නෛරන්තර්යාභ්‍යාස, දීර්ඝ කාලාභ්‍යාස විසින් බෝධිසම්භාර ධර්මයන් මුහුකරවමින් දැමී දමනු සඳහා සවන්සැණ ගබ් ගන්වා ගෙන විසිතුරු අත් බවින් සැවැ තුසී පුරයෙහි උපන්න හු.''[11]

මෙවැනි වර්ණනා පාඨයකින් අපට ප්‍රත්‍යක්ෂ වන්නේ ගුරුළුගෝමීන් අමාවතුරෙහි දී බුදුන් වහන්සේගේ චරිත කතාවේ සුවිශේෂී පැතිකඩක් විවරණය කළ ද ලත් තැනෙකදී ඒ වර්ණනාවට අනුගත වන අයුරින් විග්‍රහාත්මක රීතිය ද යොදා ගෙන ඇති බව යි. සංස්කෘත තත්සම වචන මෙන් ම පාලිය හෙළට පෙරළාගත් වදන් ද මේ එක් ම ඡේදයකින් දැක ගැනීමට පුළුවන.

තත්භව වචන යොදා ගැනීමේ දී අමාවතුර කතුවරයා තමනට ම ආවේනික රටාවකට වචන බිඳගෙන ඇති අයුරු දැක ගැනීමට පුළුවන. පහත දැක්වෙන උදාහරණයන්ගෙන් ඒ බව පෙනේ.

| | |
|---|---|
| සිද්ධාර්ථ | - සිදත් |
| කන්තක | - කත් |
| තව්තිසාපුර | - තුසීපුර |
| ජන්න | - සත් |
| රාහුල | - රාල් |
| ආළවක | - අළව් |
| මුචලින්ද | - මුදලිඳු |
| අනාත්මලක්ෂණ සූත්‍රය | - අනත්ලකුණු සුත් |
| ධම්මචක්කපවත්තන | - දම්සක් පවත් |
| ඡන්නකින්නර ජාතකය | - සන්කිවුරුදා |

උපමා රූපකාදී අලංකාර යොදා ගත්ත ද එවැනි තැන් පවා තත්සම පද භාවිතයෙන් සරසා ඇති අයුරු පහත උදාහරණයෙන් පෙනේ.

> ''බෝසතාණෝ රාල් කුමරුවන් දැකැ පහසින් බැසැ අශ්වයා කරා එළඹ 'මේ රැ තෝ මා තරවා මම් මුළු ලෝ තරවම්' නැගී අස් පිට වැඩ හුන් හු''[12]

සිංහල ග්‍රන්ථ කතුවරුනට සිංහල භාෂාවේ නව මග හෙළි කළ ග්‍රන්ථයක් වශයෙන් අමාවතුර අගය කළ හැකි වුව ද, විග්‍රහාත්මක භාෂා රීතියේ දී ඔහු අනුගමනය කළ ප්‍රභේද කීපයකි.

I තත්සම පද බහුලව යොදා ගැනීම.

II සංවාදාත්මක අවස්ථාවන්හි දී ධර්ම කරුණු සකුවට බර හෙළ වදනින් සැරසීම.

III පාලි පදයෙන් පදයට සිංහල අරුත් සැපයීම හා මූලාශ්‍ර පාඨ එලෙසින් දැක්වීම.

චරිත කථා වර්ණයකදි විග්‍රහාත්මක භාෂා රීතියේ ප්‍රභේදයන් බහුල ව හඳුනා ගත නො හැකි ය. ධර්මප්‍රදීපිකාවෙහි තරම් අමාවතුරෙහි එවැනි තැන් දැක ගැනීමට ඇතොත් ඒ ඉතා ම අල්ප වශයෙනි. බුද්ධි වර්ධනයට ඉවහල් වන විශ්ලේෂණාත්මක රීතිය තුළින් භාවයන් උද්දීප්ත කරවීමක් සිදු කිරීම දුෂ්කර කාර්යයක් බැවින් ගුරුළුගෝමී අතින් එවැන්නකට අවකාශ සිදුවී නැති බව ද පෙනේ.

බුත්සරණ බුදුන් වහන්සේගේ චරිත කථාව කියන ග්‍රන්ථයක් වුව ද එහි ගැඹුරු දහම් කොටස් ද විස්තර කොට ඇත. බුදුන් වහන්සේ විසින් අවබෝධ කර ගත් ධර්මයේ විශිෂ්ටත්වය වර්ණනා කරන තැන දී විශේෂයෙන් ම විග්‍රහාත්මක භාෂා රීති ප්‍රයෝගයන් හඳුනා ගැනීමට පුළුවන. බුදුන් වහන්සේගේ ඥාන කාය සම්පත්තිය වර්ණනා කරන විද්‍යාචක්‍රවර්තීන් භක්ති රසයෙන් පාඨකයා සන්තර්පනය කරනවා වෙනුවට විඩාවට පත් කරන්නේ යැයි පශ්චාත් කාලීන ඇතැම් විචාරකයකු ප්‍රකාශ කරනු ලබන්නේ ඔහුගේ මෙම විග්‍රහාත්මක රීතිය පසුබිම් කර ගෙන ය.

> ''බුත්සරණින් හෙළි වන්නේ බුද්ධියෙන් හා වැටහෙන නුවණින් එතරම් සකස් නො වුණු නො දමුණු විශද බහුල කල්පනා ශක්තිය කි. තමන් සිත් උතුරා යන තරම් ශ්‍රද්ධා භක්තියකින් බුත්සරණ රචනා කළ විද්‍යාචක්‍රවර්තීහුගේ කවිත්වය, විචාර බුද්ධිය ඇත්තෙකුගේ සිත් භක්ති රසයෙන් පිනවීමෙහි නො පොහොසත් එකකි. ශබ්දාලංකාරයෙන් හා විස්තරාර්ථයෙන් පිරුණු ඔහුගේ බොහෝ වර්ණනා පාඨකයන් භක්ති රසයෙන් පිනවනු වෙනුවට ඔවුන්ගේ සිත් වෙහෙස යි.''[13]

විද්‍යාචක්‍රවර්තීන්ගේ වර්ණනා රීතියේ ලක්ෂණ කීපයක් ම මෙම විග්‍රහයෙන් හඳුනා ගැනීමට පුළුවන. විග්‍රහාත්මක රීතිය මෙන් ම වර්ණනාත්මක රීතිය පිළිබඳ ව ද මෙහිදි ඔහුගේ විචාරයට හසු වී ඇත.

විග්‍රහාත්මක රීතියේ අනවශ්‍ය වර්ණනා ඇතුළත් නො වේ. වර්ණනාත්මක අවස්ථාවන් බොහෝ කොට දක්නට ලැබෙන බුත්සරණෙහි විග්‍රහාත්මක රීතිය දක්නට ලැබෙන්නේ මඳ වශයෙනි.

> ''අනුචිත දේ බැහැර කොට උචිත දේ පමණක් ගෙන උචිත පදයෙන් වර්ණනා කිරීම ශ්‍රේෂ්ඨ කවිත්වයෙහි ලක්ෂණයකි. ඒ ලක්ෂණය බුත්සරණෙහි දක්නා ලැබෙන්නේ මඳ වශයෙනි''[14].

කාව්‍යාත්මක රීතියෙහි අඩංගු භාෂා රීති අනවශ්‍ය ලක්ෂණ ලෙස බැහැර කළ නො හැකි ය. වර්ණනාත්මක රීතිය ගරු කළ විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණ රචනා කිරීමෙහි දි විග්‍රහාත්මක රීතිය යොදා ඇත්තේ ඉතා ම මඳ වශයෙනි. ඒ ඉතා ම ගැඹුරු දහම් කොටස් විස්තර කෙරෙන තැනක දි හෝ කතුවරයාගේ පාණ්ඩිත්‍යය හුවා දැක්වීමට යොදා ගන්නා අවස්ථා වර්ණනයකදි පමණි. එහෙත් විග්‍රහාත්මක රීතියේ දක්නට ලැබෙන සකු හා පාලි තත්සම තත්භව පද යෝජනය බෙහෙවින් බුත්සරණින් දැක ගැනීමට පුළුවන.

බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මයේ ගැඹුරු තැන් වැනුමට බට විද්‍යාචක්‍රවර්තීන් විග්‍රහාත්මක රීතිය ගුරු කොට ගෙන ඇත. තව ද නව අරහාදි බුදුගුණ අතර ''ලෝකවිදූ'' යන බුද්ධ ගුණය වණන කතුවරයාගේ භාෂාව බොහෝ කොට සමීප වන්නේ විග්‍රහාත්මක රීතියට යි.

> ''අවීචිය ඇතුළ දිගින් පළලින් සියක් යොදුනැ. යට ලොහො පොළොව යැ. ලොහොමය සෙවිනියැ. එකී එකී බිත්තිය නව යොදුන් පමණ ය. නැගෙනහිර බිත්තියෙන් නැඟි බස්නාහිර බිත්ති පැහැර එයින් විදගෙන පිටතින් සියක් යොදුන් පමණ තැන පැතිර සිටින්නේ යැ.''[15]

අවීචි මහා නරකය ගැන කියන්නට යන කතුවරයා හුදු හෙළුව භාවිත කර ගත්ත ද එම රීතිය ලංවන්නේ විග්‍රහාත්මක රීති ප්‍රයෝගයන්ට වේ. ''අවීචි'' යන පදය ගෙන එයට සපයන ලද අර්ථ කථන ස්වරූපයක් ඉහත පාඨයෙන් ධ්වනිත කෙරේ. එමතු ද නො ව එම පදයට අර්ථ නිරුක්ති විග්‍රහයන් මෙන් ද 'පරිකථා සැපයීමක් මෙන් ද එම විග්‍රහය හඳුනා ගැනීමට පුළුවන. එබැවින් හුදු හෙළ බස භාවිත කර ගත්තත් මෙවැනි තැන් විශේෂයෙන් ''ලෝකවිදූ'' පද විස්තරාර්ථ විග්‍රහාත්මක රීතියෙන් සැකසුනේ වන.

ගංගාරෝහණ වැනුමෙහි එන පහත සඳහන් උදාහරණය කතුවරයාගේ විවිධ භාෂාත්මක හැකියාවන් පෙන්වන අවස්ථාවක් බඳුය.

> ''අඤ්ජන පර්වතකූටයේ උස්වැ මහත් වූ ජාතියෙන් භද්‍ර වූ සත්වයෙන් දේව සත්වාදී උත්තම සත්ව ඇති දශා හෙයින් චතුර්ති දශා ඇති ශෝභා හෙයින් චතුර්ථී ශෝභායෙහි පවත්නා වූ විනීත කමින් තපස්වීන් වැනි වු ක්‍රියාවෙන් උත්තම වූ සාන්නාහ්‍යකර්ම ඖපවාහ්‍යකර්මයෙහි දක්ෂ වූ වහ්නි විරාඝාත, පානිවිරාඝාත, වෙණු පරාඝාතදී වූ නානාප්‍රකාර පරාඝාතයෙන් හික්මවන ලද්දාවූ ශාස්ත්‍රෝක්ත විධීන් .''[16]

තත්සම වදන් බහුල කොට යොදා ගෙන ඇති මෙවැනි වර්ණනයකින් හුදී ජනයාගේ ශ්‍රද්ධා භක්ති වර්ණනයක් නම් නො වනු ඇත. එහෙත් විග්‍රහාත්මක රීති ලක්ෂණ එහි ඇතුළත් ය. දැනුම් සඳහා විදග්ධයන්ට ප්‍රයෝජන රීතියක් ලෙසින් විග්‍රහාත්මක රීතිය උපකාරි ය.

''භගවා'' යන පදය විස්තර කරන්නට බට විද්‍යාචක්‍රවර්තීන් ධර්මයේ ගැඹුරු කොටස් තත්සම පද බහුල කොට ඉදිරිපත් කොට ඇත්තේ පරිකථා සපයන්නෙකු තම පදයන්ට පදගතාර්ථ සපයන දක්ෂ පරිකථාකරුවකු ලෙසිනි. ගැඹුරු දහම් කොටස් එම විස්තරයෙන් වර්ණනා නො කොට නාමික ව සඳහන් කරන ආකාරයක් දක්නට ලැබෙයි.

> ''ලෝභයැ දෝස යැ මෝහ යැ විපරිත මනස්කාර යැ, අහිරික යැ අනොත්තප්පයැ කෝපයැ , උපනාසයැ මක්ඛයැ ,පළාසය යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය මානය යැ සාඨෙය්‍ය ථම්භ යැ'....ෂඩ්විධ විවාද මූල යැ ෂඩ්විද තෘෂ්ණා කය යැ සප්තානුශ යැ අට්ඨ මච්ජත්ත යැ නව තෘෂණා මූල දශ අකුශල කර්ම පථ යැ මිථ්‍යා දෘෂ්ටි යැ අෂ්ඨශථ තෘෂ්ණා විචරිත යැ.''[17]

යනාදීන් කතුවරයා ධර්මයේ ගැඹුරු දහම් කොටස් පිළිබඳ ව කෝෂ ග්‍රන්ථයක අයුරෙන් කෙරෙන විස්තරය හුදෙක් ම අට්ඨකථා කරුවනගේ භාෂා රීතියට සමාන ව යොදා ගනිමින් විස්තර කොට ඇත. මෙවැනි රීති ලක්ෂණ බුත්සරණෙහි දක්නට ලැබෙන්නේ ඉතා අල්ප වශයෙනි. ප්‍රාඥයන්ගේ බුද්ධි වර්ධනය උදෙසා මේ වැනුම් මග උපකාරි වෙතත් සාමාන්‍ය ජනතාවගේ ශ්‍රද්ධාව වර්ධනයට උපකාරි නො වේ.

ඉහත දැක් වූ තොරතුරුවලින් අපට පැහැදිලි වන්නේ කතුවරුන් දෙදෙනා ම තම ග්‍රන්ථයන්හි භාෂා ප්‍රයෝග අතරට විග්‍රහාත්මක රීති ලක්ෂණ අනුගත කර ගෙන ඇති බව යි. තත් රීතියේ ලක්ෂණ අනුව තත්සම පද බහුල කොට ඇති භාෂා ශෛලිය ප්‍රාඥයන්ගේ දැනුම් වර්ධනයත්, කතුවරුන්ගේ විශාරද ව්‍යක්ත බව ප්‍රකට කරවීමටත් අතිශය උපකාරි වී ඇතත් සාමාන්‍ය පොදු ජනයාගේ ශ්‍රද්ධා භක්ති වර්ධනයට එතරම් උපකාරයක් වී නො මැත. ග්‍රන්ථ කරණයේ වර්ගී කරණය අනුව කතුවරුන් දෙදෙනා ම විග්‍රහාත්මක රීතිය අවශ්‍ය ප්‍රමාණයට යොදා ගෙන ඇති අයුරක් දැක ගැනීමට පුළුවන.

## <u>ආඛ්‍යානමය භාෂා භාවිතය</u>

I අඛණ්ඩ සිද්ධි විකාශය.

II තත්සම පද බහුල වුව ද රචනාවේ සරල බව.

III කතුවරයා ඉදිරියට විත් කෙරෙන විස්තරාර්ථ කථන ආදියෙන් කථා විකාශයට බාධා නො පැමිණ වීම.

IV අනවශ්‍ය වර්ණනාවෙන් හා අනවශ්‍ය අලංකාරයෙන් වියුක්ත වීම.

V පුනරුක්ති වර්ණනයෙන් තොර වීම.

VI ආඛ්‍යානයේ දී කලින් කලට සංවාද දැක්වීම හා චරිත සිතු දේ ප්‍රකෘති භාෂණයෙන් දැක්වීම.

VII ඉතා දිගු වාක්‍ය තුළ කෙටි වැකියකට සුදුසු සේ යතිය තැබීම.

VIII කෙටි වාක්‍ය යෝජනය සඳහා පූර්ව ක්‍රියාවෙන් අවසන් වන යති භාවිතය.

IX වාක්‍යංශ මගින් සිද්ධි දැක්වීම.

යන කරුණු ආඛ්‍යාන රීතියේ දී දක්නට ලැබෙන විශේෂතම ලක්ෂණ වේ. මෙම රීතිය ගුරු කොට ගත් අප කතුවරුන් දෙදෙනා ම ශ්‍රව්‍ය ග්‍රන්ථ වන තම ග්‍රන්ථත්‍රයෙන් ශ්‍රාවකයා තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධා භක්තිය ජනිත කරවීමෙහිලා තරමක් දුරට හෝ උත්සුක වී ඇත.

> ''ගුරුළුගෝමීන් කිව යුක්ත වචන ස්වල්පයකින් කිය යි. වර්ණනාව වචන ස්වල්පයකින් කරයි. වර්ණනාවක් රසවත් ලෙස කරන්නටත්, ඊට නිසි නාම පදත්, ගුණ පදත් ක්‍රියා පදත් ඇතැයි සැලකූ ගුරුළුගෝමීහු ඒ පද සොය සොයා සුදුසු තැන ම යෙදූ හ.''[18]

අනවශ්‍ය වාග් බාහුල්‍යයෙන් තොර ව අවශ්‍ය පදය අවශ්‍ය තැන යොදා කරන වර්ණනය ආඛ්‍යාන රීතිය යි. සරල බව හා සම්පූර්ණ බව එම වර්ණනය තුළ, රීතිය තුළ අන්තර්ගත ය.

> ''ගුරුළුගෝමීහු අවස්ථාවට උචිත භාෂා ව්‍යවහාරය යොදා ගනිති. අර්ථ ව්‍යාඛ්‍යානයෙහි ද පරිකථා කිරීමෙහි ද ඔවුහු සංස්කෘත මිශ්‍ර භාෂා රීතිය උපයෝගි කොට ගනිති. වර්ණනයෙහි හා කථනෙහි එතුමෝ අමිශ්‍ර සිංහලය යොදති ........කවර රීතියකින් ලියුවද ඔවුහු චතුර ලේඛකයකු ලෙස රචනා කරති. දෙකෙහි ම ඔවුහු එක සේ ප්‍රවීණය හ.''[19]

ආඛ්‍යානමය රීතිය ගුරු කොට ගත් තැන්හි ග්‍රන්ථ දෙකෙහි ම කතුවරුන් සාමාන්‍ය ජනයාගේ ශ්‍රද්ධා භක්ති වර්ධනයට අවස්ථාව සලසා ගෙන ඇති අයුරක් දක්නට ලැබෙයි.

ධර්මප්‍රදීපිකා ග්‍රන්ථ විෂය අතින් සලකන කල්හි ඉතා දීර්ඝ ආඛ්‍යාන රීතියක් යොදා ගත් තැන් සොයා ගැනීම අසීරු ය. එහෙත් ඇතැම් පදයකට පරිකථා සපයන කල්හි ඒ හා බැඳි අවස්ථාවන් වර්ණනාවට හසු කරන්නේ ආඛ්‍යානමය රීතිය යොදා ගත් තැන් දක ගැනීමට පුළුවන. එවැනි තැනෙක දී විටෙක අතිශය ශ්‍රද්ධාවත්, අතිශය භක්තියත් තෙරුවන් කෙරෙහි උද්දීපන කෙරෙන අවස්ථාවන් ද ධර්මප්‍රදීපිකාවෙන් හඳුනා ගැනීමට පුළුවන.

ආඛ්‍යානමය රීතිය ගුරු කොටගත් ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේ දි එයින් තම අභිමතාර්ථ සාධනයට විපුල ප්‍රයෝජන ලබාගෙන ඇත. සංස්කෘත ආලංකාරිකයන් විසින් දක්වන ලද දශ ප්‍රාණය ම හෙවත් දශ ගුණ සහිත වෛදර්භී රීතියෙන් සැකසුණ ඔහුගේ බස නිතැතින් ම ආඛ්‍යාන රීතිය පොහොසත් කළේ ය.

> ''සංස්කෘත භාෂාව පාදක කරගෙන බුද්ධ ධර්ම විෂයෙහි මෙන් ම සංස්කෘත ආඛ්‍යානවල දක්නට ලැබෙන වෛදර්භී, ගෞඩී පංචාලී වැනි රීති විෂයෙහි ද ගුරුළුගෝමීන් තුළ පරිචයක් පැවති බව ධර්මප්‍රදීපිකාවේ දීපිකා මාධ්‍යයෙන් ප්‍රකට කෙරේ. මෙම සංස්කෘත රීතිවල පදනම දශ ගුණ හෙවත් දශ ප්‍රාණ වන හෙයින් .....

ධර්මප්‍රදීපිකාවේ දශ ගුණ ම නවතා ගත් වෛදර්භී රීතිය නගාගත හැකි වර්ණනා ප්‍රදේශ සුලභ ය."[20]

ආඛ්‍යානමය රීතියේ විශේෂිත ලක්ෂණයන් කවරාකාරදැයි හඳුන්වා දෙන මෙම විචාරකයා ගුරුළුගෝමින් ධර්මප්‍රදීපිකාවේ දී තත් ක්‍රමෝපායයන් අනුගමනය කළ අයුරු පැහැදිලි කළ අයුරුයි ඒ. සමාස පද විරහිත මුක්තක ශෛලිය ද, දීර්ඝ සමාස පද ඇති උක්කලිකප්‍රාස වැනි ශෛලීන් ද යොදා ගනිමින් ගුරුළුගෝමීන් ආඛ්‍යානමය රීතිය ධර්මප්‍රදීපිකාවෙන් තහවුරු කොට දක්ව යි. ශ්‍රව්‍ය ග්‍රන්ථයක් තුළ බුදුන් වහන්සේගේ රූපකාය, ධර්මකාය පිළිබඳ මෙවැනි භාෂා රීතියකින් ඉදිරිපත් කෙරෙන වර්ණනයකින් නිතැතින් ම ශ්‍රෝතෘ ජනයාගේ සිතෙහි ශ්‍රද්ධා භක්ති ජනිත වන්නේ ය. ජනිත වූ ඒ සිතුවිලි නිතැතින් ම සංවර්ධනයට පමුණුවන්නේ ය.

ධර්මප්‍රදීපිකා කතුවරයා ග්‍රන්ථය ආරම්භ කරන්නේ ද ශ්‍රෝතෘ ජනයා තුළ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා සිත් ඇතිවන පරිදි ආඛ්‍යාන රීතිය උපයෝගි කරගෙන ය. සරාසැකිකප් සුවහසක් මුළුල්ලෙහි පුරාවට පාරමිතාවන් පුරා අවසන බුද්ධත්වයට පත් වූ ආකාරය ඉතා සංක්ෂිප්ත ව කතුවරයා ඉදිරිපත් කොට ඇත. එම පාඨය අසන කියවන කාහට වුව ද සිතට නගින්නේ බුදුන් වහන්සේ කෙරෙහි අපරිමිත භක්තියකි. අපරිමිත ශ්‍රද්ධාවකි.

> "අප බුදුන් සරා සැකි කප් මතුයෙහි කුලුණු නුවනින් යුත් මහතවුසක් වැ දිවකර බුදුන් හමු වැ අතටපත් නිවන් සසර සේ පියා සතුන් සඳහා විඳුනා සසර දුක් නිවන් සේ ගෙනැ භවදුර්ගයට වැදෑ පැරුම්පුරා තුසී පුර පැමිණ දස දහස් ලෝධාහි දෙව්බඹුන්ගේ අයජමෙන් කිඹුල්වත්හි ඉපිදැ වැඩිවිය පැමිණ මහභිනික්මන් කොටැ පැවිදි වැ මහා වීර්ය කොට බෝධි පර්යඞ්කාරූඪ වැ මාරවිජය කොට සර්වඥඥපද ප්‍රාප්ත වැ හුනස්නෙන් නැඟී පූර්වෝත්තර දිශාභාගයෙහි වැඩ සිට සප්තාහයක් අනිමිෂ ලෝචන යුගයෙන් පුදන ලද ජය මහා බෝධි යැ. තත් ප්‍රභ ව වූ එලරුහ මහා බෝධි යැ, තදවය ව වූ ශාඛා මහා බෝධි යැ, යන් තුන් මහා බෝධීන්ගේ වංශයෙන් සහස්‍ර රශ්මීන් විභක්ති පදයන් අතුරෙන්."[21]

ගුරුළුගෝමීන්ගේ මෙම වර්ණනාව කියන, අසන, කා හට වුව ද බුදුන් වහන්සේ කෙරෙහි ඇතිවන්නේ ශ්‍රද්ධාවකි. තත්සම පද සහිත ව කෙරෙන තත් ග්‍රන්ථාරම්භ වර්ණනය දීපංකර පාද මූලයේ පටන් බුද්ධත්වයට පත්වීම දක්වා සිද්ධි අඛණ්ඩ ව සංක්ෂිප්ත ව ඉදිරිපත් කොට ඇත. අනවශ්‍ය වර්ණනාවෙන් අලංකාර නො කොට කිව යුත්ත සර්වාර්ථයන් ධ්වනිත වන අයුරෙන් ප්‍රකාශ කොට ඇත. පූර්ව ක්‍රියාවෙන් වාක්‍ය අතර සම්බන්ධතාව ගොඩ නගා ගනිමින් පර්වත මුදුනක සිට ගලා බසින ජල ප්‍රවාහයක් මෙන් අඛණ්ඩ සිද්ධි වර්ණනයක් ඉදිරිපත් කොට ඇත. තත්සම පද යොදා ගත්ත ද එම වර්ණනය සරල ය, සුගම ය. වර්ණිත අවස්ථා අර්ථයන්හි බුදුන් වහන්සේ කෙරෙහි භක්තිය දැනවීමෙහි ද සමර්ථය ය. තමා අතට පත් නිවන් හැර පියා අනේක සසර දුක් සත්වයන් වෙනුවෙන් ඉවසා වදාළ බුදුන් වහන්සේ කෙරෙහි පාඨක හද තුළින් උද්දීප්ත වන්නේ ගෞරව සම්ප්‍රයුක්ත ශ්‍රද්ධාවකි.

පරිකථා ග්‍රන්ථයක් කරන ගුරුළුගෝමීහු එයට උචිත භාෂා ශෛලිය විවිධාකාරයෙන් හසුරුවා ගන්නට පොහොසත් වූහ. ආඛ්‍යාන රීතියේ දි දක්නට ලැබෙන චූර්ණකාදී ශෛලීන් ඔහුගේ භාෂා ප්‍රයෝගයන් අතර දක්නට ලැබෙන බව ඇතැම් විචාරකයකුගේ අදහස යි. සමාස පද විරහිත මෙන් ම සමාස පද බහුල ශෛලීන් ද අනුගමනය කරමින් ආඛ්‍යාන රීතිය පොහොසත් කර ගත් කතුවරයා ධර්මප්‍රදීපිකාවේ ලද සෑම විට ම එමගින් ශ්‍රාවකයා හා පාඨකයා තුළ ශ්‍රද්ධා භක්ති ඉපද වීමෙහිලා ප්‍රශස්ත දක්ෂතාවක් දක්වා තිබේ. ලත් අවස්ථාවෙන් එවැනි රසයක් ජනිත කරවීමට කතුවරයා සෑම විට ම උත්සාහ ගත්තේ ය.

> "තවද ගුරුළුගෝමීන් පරිකථා කරණයට උචිත භාෂා රීතිය පෙළ ගස්වා ගැනීමේ දි සමාස විරහිත මුක්තක ශෛලිය ද දීර්ඝ සමාස ඇති උත්කලික ප්‍රාය ශෛලිය ද කෙටි සමාස ඇති චූර්ණක ශෛලිය ද අවස්ථාවෝචිත ව පරිහරණය කර තිබෙන විලාසය සලකා බැලී ම වැදගත් වේ."[22]

බුදුන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වර්ණනා කරන තැනෙක්හි දි ගුරුළුගෝමීන් තුළින් විශද වන්නේ ආඛ්‍යානමය රීතිය යි. කාව්‍යාත්මක රීතිය ද නැත්තේ නො වේ. රූපකාය සම්පත්තියෙහි අසමසමතාව වර්ණනා කරමින් කතුවරයා අන්‍යයන් තුළ භක්ති රසය ජනනය කරන්නේ මෙසේ ය.

> "උස්සංඛපාදො යන තන්හි ඔවුන් උස්සංඛපාද පරිදි කීයේ යැ යත් ? අනුන් බොලට බටිපය වෙයි. එයින් ඔවුන් පා ඇණපට සෙයින් තද වෙයි. කැමති සේ නො පිරිවැටෙයි. යනුවන් පතුල් නො පැනෙයි. බුදුන්ට වූ කල නැඟී මත්තෙහි ගුල්ඵයො පිහිටිය හ. එයින් බුදුන් වඩනා කලැ නාභිය පටන් ගෙන ඌර්ධවකාය නැව සිටි රන් පිළිමයක් සෙයින් නිශ්චල වෙයි. අධඃකාය මැ චලිත වෙයි. සුවයෙන් පාදයෝ පරිවර්තිත වෙති."[23]

පරිකථාමය ලක්ෂණ එම වර්ණනාවේ ඇතුළත් වුව ද රසය විඳීමට එයින් ප්‍රබල බාධාවක් ඇති නො වේ. අසා සිටින්නට වුව ද අපහසුතාවක් ඇති නො වේ. එහි දි ශ්‍රී ශරීර ලක්ෂණය ද එක දිගට වර්ණනා කරයි. "නැව සිටි රන් පිළිමයක් සෙයින්" වැනි සරල උපමා ද අර්ථ උද්දීප්තියෙහි පොහොනා විය. මේ ලෙසින් කෙරෙන දෙතිස් මහා පුරුෂ ලක්ෂණ එක දිගට කියවාගෙන යා හැකි අර්ථ රසයෙන් පරිපෝෂිත වන අයුරෙන් රචනා කොට ඇත.

තවද බුදුන් වහන්සේගේ "ඥානබල" ගැන කියන්නට වන් ගුරුළුගෝමීන් එහි දි බුදුන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්ය බල මහිමය වර්ණනාවට හසු කර ගන්නේ ආඛ්‍යානමය රීතිය ලේඛනයට හසුරුවා ගෙන ය.

"බුදුන් යමක ප්‍රාතිහාර්ය කරන කල්හි ඔවුන්ගේ ශරීරයෙන් නික්මෙන ද්විතීය රශ්මීහු පූර්ව පූර්ව රශ්මියට යුවළ යුවළ ව පවත්නවුන් සෙයින් එකක්ෂණයෙහි මැ පවතිත්. කීයේ යැ යත් ? දෙසිතෙක් එකවට උපදනේ නො වෙයි. තත් තත් රශ්මීන් සඳහා ආවර්ජනා ද පරිකර්ම ද අධිෂ්ඨාන ද වෙන වෙන ම යැ. බුදුහු නිල්රස් සඳහා නීලකෘත්ස්න සමාප්තියට සමවැදිති. රන්වන් රස් සඳහා පීතකෘත්ස්න සමාපත්තියට සමවදිති.''[24]

ආඛ්‍යානමය රීතියේ වුව ද අවශ්‍ය තැනෙක අර්ථෝද්දීපනය උදෙසා යොදා ගත් සරල පද පුනරුක්ත යෙදීම් දක්නට ලැබේ. ධර්මප්‍රදීපිකාවේ යට දැක් වූ උද්ධෘත පාඨය බුදුන් වහන්සේගේ යමක ප්‍රාතිහාර්ය ගුණ මහිමයේ විශේෂත්වය මනා ව වර්ණනා කරයි. ප්‍රකාශ කළ යුතු දෑ අනවශ්‍ය වර්ණනාවෙන් තොර ව අඛණ්ඩ ව ගලා යන වර්ණනයක ආකාරයෙන් ප්‍රකාශිත ය. තත්සම පද බහුල කොට සමාස පදයෙන් යුක්ත ව වර්ණනා කර ඇති එම පාඨය අසන ශ්‍රාවකයාගේත් කියවන පාඨකයාගේත් හදවතට නැගෙන්නේ ගෞරවයකි. නීලපීතාදී ෂඩ් වර්ණනයන් බුදු සිරුරින් එක විට විහිදුනා සේ බුදුන් වහන්සේ ඒ ඒ සමාපත්තියට මොහොතින් මොහොත සමවදින ආකාරයේ වාග් චිත්‍රයක් ශ්‍රෝතෘ ජනයාගේ හද තුළ චිත්‍රණය කරන්නට ඒ වර්ණනය අතිශයින් ම සමර්ථ ය.

"අත්තදාන පරිදීපනයට තිත්ථියපරිමද්දනං යමක පාටිහාරියං දස්සෙන්තො"[25]

යන පදයට පරිකථා සපයන ගුරුළුගෝමීන් එහිදි උපයෝගි කර ගෙන ඇත්තේ ආඛ්‍යානමය රීතිය යි. සංවාද යොදා ගනිමින් ද චරිත සිතු දෙය ප්‍රකෘති භාෂණයෙන් ඉදිරිපත් කරමින් ද කතුවරයා එම අවස්ථාව මනා ව වර්ණනා කොට ඇත. මුද්‍රිත පිටු දෙකක් පමණ වන එම වර්ණනා අවස්ථාවෙන් බුදුන් වහන්සේ හා සමග ඍද්ධි ප්‍රාතිහාර්ය පාන්නට ආ තීර්ථකයන් බුදුන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් හා ප්‍රාතිහාර්ය බලයෙන් පරාජයට පත් වූ අයුරුත්, බුදු සව්වන් පවා තීර්ථකයන්ට ඇදහිය නො හෙන තරමේ ප්‍රාතිහාර්ය පෑමෙහි සමර්ථ බවත් එම අවස්ථාවෙන් වර්ණනා කොට ඇත. එවැනි වර්ණනා තැනෙක්හි ද පාඨක හා ශ්‍රාවක සිත ශ්‍රද්ධා භක්තියෙන් පිරී ඉතිරී යන්නේ ය.

අමාවතුර කතුවරයාගේ රීතියේ විශේෂතම ලක්ෂණය සංක්ෂිප්ත භාවය යි. කිව යුත්ත අනවශ්‍ය වර්ණනාවෙන් බර නො කොට සීමිත වචන ප්‍රමාණයකින් සම්පූර්ණ අර්ථෝද්දීපනය වන ලෙස භාෂාව හදුරුවා ගත් කතුවරයා හෙළ බසේ තරම ගද්‍ය වර්ණනයකට පොහොනා බැව් මනා ව ප්‍රකට කොට ඇත. ආඛ්‍යානමය රීතියේ ලක්ෂණ මනා ව තීව්‍ර කරමින් ශබ්දාර්ථයන්ට හානියක් නො වන ලෙස අමාවතුර ලේඛන රීතිය සැකසී ඇත. කෙටි වැකි, හෙළු වදන්, තත්සම පද භාවිතය, සංවාද දැක්වීම හා ඒ ඒ චරිතයන් සිතු දේ ප්‍රකෘති භාෂණයෙන් දැක්වීමාදී ආඛ්‍යානමය ලක්ෂණ අමාවතුරෙන් මනා ව පැහැදිලි වේ.

"අදහස් පැවසීමෙහි ගුරුළුගෝමීන් හෙළුව කොතරම් දක්ෂව යොදා ඇත් ද යනු දක්නට පුළුවන. හෙළු වහරේ අර්ථ ශක්තියේ තියුණු තරම පිරික්මිය යුතු නම් බැලිය යුත්තේ ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි එන හෙළුව යි. වරක් කියවා බැලූ දේ නැවත

කිය වූ විට අලුත් හැඟීම් පාඨකයා තුළ දනවීම නිසා හෙළුව හුරු දනට අමාවතුර බස සැම විට ම නවතාවෙන් යුතු ව කියවා රස විඳිය හැකි යි. කෙටි වචන හා කෙටි වැකිවලින් පුදුමාකාර සේ අරුත් දනවීම ගුරුළුගෝමීන්ගේ මේ රචනයෙහි ඇති විශේෂ සලකුණ යි."[26]

හෙළු වහරේ ව්‍යංජනා ශක්තියේ තරම විදහා පෑ ගුරුළුගෝමීන් අමාවතුරෙහි සිද්ධි හා අවස්ථා විකාශයට එමගින් ලබා ගත් ආධාරය සුළුපටු නො වේ. විටෙක කතුවරයා සංවාද යොදා ගන්නා තැන තත්සම පද යොදා ගෙන ඇත. ඒ හුදෙක් බුදුන් වහන්සේ හා වාදාරෝපණයට පැමිණ ධර්මයේ ගැඹුරු තැන් විමසන විටෙක දීය. මුලින් කතුවරයා ප්‍රතිඥා දුන් ආකාරයට සැකෙවි රීතිය පෝෂණය කරමින් භාෂාවේ පදයන්ගේ අර්ථ ශක්තියේ තරම කියා දුන් අත් පොතක් වශයෙන් අමාවතුර අගය කළ හැකි ය. කෙටි වැකි භාවිත කර ගත් කතුවරයා කිසිදු විටෙක අනවශ්‍ය වර්ණනාවකට නො ගියේ ය.

> "කිවයුතු දෙය අනවශ්‍ය වාග් බාහුල්‍යයෙන් තොර ව කොටින් පැහැදිලි ව කීම ගුරුළුගෝමීන්ගේ ශෛලිය විය. එහෙයින් එය බොහෝ සෙයින් බුද්ධිමත් ජනයා විසින් අගය කළ හැකි ශෛලියකි."[27]

ප්‍රාඥයන්ට පමණක් යැයි අමාවතුර බස වෙන් කරන්නේ සැකෙවි රීතියේ පිහිටා විය යුතු ය. නුවණ මද වූ ද ශ්‍රාවකයා සඳහා අමාවතුර බස ප්‍රමාණවත් වන අයුරක් දක ගැනීමට පුළුවන. භාෂාව සැකෙවි වුව ද අශිථිල බවක් දක ගත නො හැකි ය. ධර්මය ගැන අවබෝධය තරමක් හෝ ඇත්තන්ට පාලි ක්‍රමයෙන් ගත් හෙළු ශබ්ද අර්ථ නිපද වීමෙහිලා සමත්කම් දක්වන්නේ ය. එය සකුවට බර වූයේ නම් විචාරකයාගේ යට නිගමනයන්ට එළඹිය හැකි ව තිබුණි.

> "බෞද්ධ සංස්කෘතියට ද, බෞද්ධ රටක පරිසරයට ද ගැළපෙන්නේ වාග් ප්‍රපඤ්චයයෙන් හා අලංකරණයෙන් දූෂණය වුණු සංස්කෘත රීතිය නො ව පාලි රීතියයි. එහෙයින් පාලි රීතිය ගුරු කොටගත් ගුරුළුගෝමීහු අතින් හැඩ ගැසුණු දේශීය මාර්ගයක් ලෙස සැලකිය යුතු අමාවතුර රීතිය නවීන කවර බසක වුව ද උසස් සරල රීතියට දෙවන නො වන්නකි."[28]

අමාවතුරෙහි දක්නට ලැබෙන විශේෂතම භාෂා රීතිය ආඛ්‍යානමය රීතිය යි. එම රීතිය මූලිකත්වයේ තබාගෙන කෙරෙන මෙම විචාර මතවාදයන්ගෙන් අමාවතුර කතුවරයාගේ තත් ආඛ්‍යානමය රීතියේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීමට පුළුවන.

පූර්ව ක්‍රියාවෙන් යුක්ත කොට දීර්ඝ වාක්‍යයක් තුළට අන්තර් වාක්‍ය යෙදීම ආඛ්‍යානමය රීතියේ ලක්ෂණයකි. එම රීති ලක්ෂණය සිංහල ලේඛකයන් කෙරෙහි හුරු පුරුදු කරවීමෙහිලා ගුරුළුගෝමීන්ගේ අමාවතුර මූලිකත්වයක් ගනී. අමාවතුරෙහි එබඳු තැන් කීපයක් ම නිදසුන් වශයෙන් සපයමින් වැලිවිටියේ සෝරත නාහිමියෝ මෙසේ ප්‍රකාශ කරති.

"ගුරුළුගෝමීන් අමාවතුරෙහි දි සිංහල ව්‍යාකරණ ක්‍රම නො ඉක්ම වුවත් වාක්‍ය යෝජනය හැම විට ම පාලි භාෂානු ගත වීයැ. වාක්‍යයක මධ්‍යයෙහි අනික් වාක්‍ය යෙදීම වරදකැයි ආලඞ්කාරිකයන් කියතත් ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි එබඳු තැන් රාශියක් දැකිය හැකි ය."[29]

කෙටි වාක්‍ය යොදා ගැනීම තුළින් ආඛ්‍යාන රීතිය තහවුරු කෙරෙන අතර අමාවතුර කතුවරයා දීර්ඝ වාක්‍ය තුළට කෙටි වාක්‍ය ඇතුළත් කොට ඇති බව යට දැක් වූ විචාරක මතයන්ගෙන් තහවුරු කෙරේ. තමන් කියන්නට යන වස්තු විෂයෙහි ප්‍රබලතාව ඉස්මතු කොට දැක්වීමට එමගින් කතුවරයාට ඉඩ ප්‍රස්ථා ලැබී ඇත. පුරිස දම්ම සාරථී පද වර්ණනාවෙන් ගුරුළුගෝමීන් පාඨක හා ශ්‍රාවක යන දෙපාර්ශවයටම තුළට බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනිත කොට ඇති බව පහත නිදසුන් විමසීමෙන් පෙනේ.

අංගුලිමාල දමන කතාවේ දි ගුරුළුගෝමීන් ශ්‍රාවක විස්මයට පත්වන අයුරෙන් සිද්ධි පෙළ ගස්වා ඇත. අංගුලිමාල සොයා වඩිනා බුදුරජාණන් වහන්සේට අගුල්මල් හමුවන තැන උද්වේගකර වර්ණනයකින් ආඛ්‍යානමය රීතිය ඇසුරු කොට ගෙන වර්ණනා කරන්නේ මෙසේ ය.

"සොර ක්ලාන්ත විය. මියෙහි කෙළ සිඳී ගියේ ශරිරයෙන් ස්වේද බස්සී. එකල අඟුල්මල් සොර විස්මිතැ ව "මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳ ගණිම්ම යැ .... එතෙකදු වුවත් මම් මේ මහණහු පියවි ගමණින් යන්නහු බල පමණින් දිවෙනුයෙම් හඹා නො ගත හෙම්'යි සිටැ බුදුනට සිට මහණයි කීය."[30]

අසන්නා තුළ කුතුහල රසය දනවමින් ඉතා කෙටි වැකි මගින් තත් අවස්ථාව වර්ණනාවට හසු කර ගෙන ඇත. සිද්ධි ගලා යාමේ දි කිසි බාධාවක් සිදු වී නො මැත. චරිත සිතු දේ ප්‍රකෘති භාෂණයෙන් ඉදිරිපත් කොට ඇත. අවසානයේ අගුල්මල් සිතන සිතුවිලි තුළින් ශ්‍රාවකයා, පාඨකයා තුළ නිරන්තර බුදු බැතිය වඩවා ලන්නට කතුවරයාට හැකි වී ඇත. "මම තියුණු නුවණ ඇති සම්මා සම්බුදුන් විසින් දක්නා ලද බන්දෙමි. බුදුහු මට සංග්‍රහ පිණිස මෙයට වැඩි යැ යි" සිතන සිතුවිල්ලෙහි පවා ශ්‍රාවකයාගේ මුවගි'න් සාදුකාර පිටවෙතැයි පැවසුව ද වරදක් නො වේ. ආඛ්‍යානමය රීතිය එතරම් ම ප්‍රබල ලෙස කතුවරයා යොදා ගෙන ඇත.

"හේ බුදුන්ගේ බස් අසා ඇස් විවර කොට බුදුන්ගේ සිරුරු බලා පිළිබඳ සංවේග ඇති වූ යේ බුදුන් තෙදින් සිඳී ගිය සුරාමඳ ඇත්තේ අතබහා කන්පත් සලමින් ගොස්, බුදුන් පා පිට බැස හොති. "නාලාගිරිය" තෝ තිරිසන් වරණයෙහි මම බුදු වරණයෙමි. මෙතැන් පටන් ගෙණ චණ්ඩ පරුෂ නො වා මිනීමරු නො වා. මෙත් සිත් පිළිලබයි'වදාරා දකුණු අත දික්කොට "මා කුඤ්ජර නාගමාසදො" යනාදීන් ධර්ම දෙසූ. ඔහුගේ සියල් සිරුරු ප්‍රීතීන් නිරන්තර වැ පිරිණ. ඉදින් හේ තිරිසන් නො වී නම් සෝවාන් වූයේ ය."[31]

නාලාගිරි දමන කතාවේ දි ගුරුළුගෝමීන් ආඛ්‍යානමය රීතිය යොදා ගනිමින් අසන්නන්ගේ සිත් ශ්‍රද්ධා භක්ති රසයෙන් පුරවමින් අවස්ථාව මනහර ව ඉදිරිපත් කොට ඇත. කෙටි වැකිය. කියවන අසන ජනයාට රස විඳ ගැනීමෙහි දුෂ්කරතාවක් ද නැත. පූර්ව ක්‍රියාවෙන් සම්බන්ධ කොට දිගු වැකි යොදා ගෙන ඇති අයුරක් ද පෙනේ. ජාතකට්ඨ කථාවට අනුව යමින් සැකෙව් රීතියක් ගුරු කොට ගත්ත ද කතුවරයා තම අභිමතාර්ථ සාධනය සඳහා එය බෙහෙවින් ඉවහල් කොට ගත් සැටියක් ඉහත නිදසුන් පාඨයෙන් පෙනේ.

"භවනයෙහි දොර තෙමේම බුදුනට විවර වියැ. බුදුහු ඇතුළු භවනයට වැද යම් අස්නෙක අළව් යක් උතුම් මගුල් දවස් හිඳ මහත් සිරි අනුභව කෙරේ ද ? එම දිවරුවන් මුවා පළඟ මත්තේ වැඩ හිඳ රන්වන් රස් වුහුටහ. එසඳ යක්ෂයාගේ කාන්තාවෝ අවුදු බුදුන් වැඳ පිරිවරා හුන්හු. බුදුහු ඔවුනට "තෙපි දන් දී සිල් රැක පුදන්නට නිස්සන් පුදා මේ සැපතට පත් ව දැනුදු එසේ ම කරව."[32]

ක්‍රමවත් අනුපිළිවෙළක් ඇති කතා ශෛලිය මෙ මගින් පැහැදිලි ය. මෙලෙසින් ඉදිරියට දිවෙන කතාවෙන් පාඨකයාගේ හා ශ්‍රාවකයාගේ කතා රසයට බාධාවක් ඇති නො කරයි. සංවාද හා දෙබස් යොදා ගැණෙන තැන විටෙක නාට්‍යමය ලක්ෂණ දනවයි. ආළවකගේ අණින් එපිට මෙපිට වඩනා බුදුන් වහන්සේගේ ක්‍රියා කලාපයත් අවසාන බුදුන් වහන්සේගේ අධිෂ්ඨාන බල මහිමයත් පිළිබඳ විස්තරය ශ්‍රවණය කරන විට හදවතට නැගෙන්නේ භක්තියකි. ගෞරවයකි. ශ්‍රද්ධාවකි. පාඨක මනස තත් භාවයන්ගෙන් පරිපූර්ණ කිරීමට අමාවතුර කතුවරයා ගේ මේ ආඛ්‍යානමය රීතිය බෙහෙවින් ඉවහල් විය.

"ග්‍රන්ථයක කතා රීතිය විමසීමේ දි සැලකිල්ලට ගත යුත්තේ එහි එන ආඛ්‍යානමය කොටස් ය. අමාවතුරේ කතාවල පැහැදිලි ආරම්භයක් හා අවසානයක් ද අඛණ්ඩ ව ගලා යන සිද්ධි මාලාවක් ද ඇත. අර්ථ කථන ධර්ම විග්‍රහ ආදිය නිසා සිද්ධි සංඝටනය බැඳීමක් වූ යේ කලාතුරකින් තැනක ය. .... සූත්‍රවල වනපොත් කිරීමේ පහසුව තකා යෙදෙන පුනරුක්තිමය වාක්‍ය බැහැර කොට හරය පමණක් ගත්තේ ය. අට්ඨකථාවල අර්ථ වලින් ප්‍රස්තුතයට අදාළ කොටස් පමණක් ගෙන සිද්ධි සංවාද ආදීය කතා මාලාවට අනුරූප වන සේ ගළපා කතා රචනා කළේ ය."[33]

භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා ගුරුළුගෝමීන්ට අභිමත සැකෙව් රීතිය තුළ තත් ආඛ්‍යානමය රීතිය හසුරුවා ගෙන ඇත. ශබ්දාර්ථයන්ට හානියක් ඇති නො වන පරිදි පාඨක ශ්‍රාවක පිරිසගේ රසඥතාවට හානි නො වන අයුරෙන් එම භාෂා රීති ප්‍රයෝගය අමාවතුරෙන් මනා ව පැහැදිලි කරයි.

"කුඩා රළ කිහිපයක් එක් වීමෙන් විශාල තරංගයක් ඇති වන්නා සේ කෙටි වාක්‍ය ඛණ්ඩ කිහිපයක් එකපිට එක පැටවීමෙන් දීර්ඝ වාක්‍යයක් ඇති වේ. එබඳු දීර්ඝ වාක්‍ය මේ ගද්‍ය රීතියේ විශේෂ ලක්ෂණය කි."[34]

ධර්ම දේශනා විලාසය ගුරු කොට ගත් විද්‍යාචක්‍රවර්තීන් කර්ණ රසායන සුලලිත ආඛ්‍යානමය රීතියක් ගොඩ නගා ගෙන ඇති අයුරු බුත්සරණ විමසීමෙන් මනා ව පැහැදිලි වේ. දිගු වාක්‍ය තුළට කෙටි වාක්‍ය යොදා ගත්ත ද කතාව තුළ දී විටෙක දෙබස් හා සංවාද යොදා ගත්ත ද නිරායාසයෙන් ගලා යන පුවත් හා අවස්ථා වර්ණනා බුත්සරණෙහි දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි. අතිශය වර්ණනාත්මක රීතිය පිහිට කරගත් බුත්සරණෙහි අඛ්‍යානමය රීතිය දැනවෙන ප්‍රධාන ම සාධකය ලෙස දක්වන්නට හැක්කේ එහි අගට යොදා තිබෙන වෙස්සන්තර ජාතකයෙන් පමණි. පිළිවෙළින් කතාවක් කියනවා වෙනුවට විද්‍යාචක්‍රවර්තීන් කරන්නේ අසන්නා තුළ කුතුහලය දැනවෙන භාවයන් අවුස්සන අවස්ථාවෙන් කතාව පටන් ගැනීම යි. පුවතක, සිද්ධියක තීරණාත්මක අවස්ථාවෙන් කතාව පටන් ගැනුම ආඛ්‍යානමය රීතියේ ලක්ෂණ නො වේ. බුත්සරණෙහි මුලට එන චුල්ල ධර්මපාල ජාතකය, ඡද්දන්ත ජාතකය ආදි තැනේ දී මේ ආඛ්‍යාන රීතියේ උපයෝගිතාව පෙනේ.

> "එහෙත් මුල-මැද-අග මැනවින් ගැළපුණු කතා බුත්සරණේ විරල ය. බුදුගුණ වර්ණනාවේ ම එක උපාංගයක් ලෙස ආඛ්‍යාන කීපයක් බුත්සරණට ඇතුළත් ව ඇත. අගට අමුණා ඇති වෙස්සන්තර ජාතකය හැරුණු විට ග්‍රන්ථයේ මුල් කොටසේ ජාතක කීපයක පිණ්ඩාර්ථය දැක් වේ."[35]

බුත්සරණ කතුවරයාගේ පරමාර්ථය දෙස හා ග්‍රන්ථ රීතිය දෙස බලන කල්හි ඔහුගෙන් ආඛ්‍යානමය රීති ප්‍රයෝග වෙසෙසින් බලාපොරොත්තු විය නො හැකි ය. තත්සම පදයෙන් බහුල වර්ණනාවක් දක්නට ඇත ද එය අතිශය වර්ණයෙන් භූෂණය කොට ඇත. විශේෂයෙන් ම අමාවතුරට වස්තු විෂය වූ පුවත් ම බුත්සරණට ද වැද්ද ගෙන ඇත. එහෙත් ඒ වර්ණනා දෙකෙහි වෙනස නම් අමාවතුර මුල මැද අග මනා ව ගැළපෙන ලෙස කතාව අනුපිළිවෙළින් ඉදිරිපත් කොට ආඛ්‍යානමය රීතිය රැකගෙන තිබීම යි. විද්‍යාචක්‍රවර්තීන් ශ්‍රාවකයාගේ හා පාඨකයාගේ භාවයන් ප්‍රකෝප කරන තැනින් අරඹා කතාව ඉදිරියට ගෙන යයි. ජාතක කතාවන් ඉදිරිපත් කරන තැනෙක් හිදි පමණක් බුත්සරණේ ආඛ්‍යාන රීතිය පෙනේ. වෙස්සන්තර ජාතකය කියන අසන කාගේ වුව ද නෙතගට කඳුළු වැගිරෙන සුළු බස් වහරක් යොදා ගනිමින් ඒ ආඛ්‍යානමය රීතිය රැකගෙන ඇත.

> "ධර්මපාල කුමාර වැ මහා ප්‍රතාප රජහට පුත් වැ සත්මැම් වැ කිරි සුවඳ වහන ස්වභාවයෙන් මැ මහනෙල් මලකට බඳු වූ සුවඳ ඇති යහපත් ශ්‍රී මුඛයක් ඇති වැ මහනෙල් පෙති දෙකක් සේ දික් වූ නිල් පෙති වැටි හෙන්නා සේ ඉතා නිල් වූ ඇස් දෙකක් ඇති වැ රන් පියුම් පෙත්තකට බඳු වූ දිවි දළින් ඔප් නැගූ රන් පිළිමයක් සේ යහපත් රුවක් ලද හ."[36]

බුත්සරණෙහි එන චුල්ලධර්මපාල ජාතකය කියන අයුරු යි මේ. මේ කෙටි පාඨයට ම කතුවරයා උපමාලංකාර තුනක් යොදා ගෙන ඇත. කාව්‍යාත්මක රීතියට එය අනුගත වුව ද එලෙසින් පටන් ගන්නා ධර්මපාල ජාතකය පිළිවෙළ නො සිඳ ඉදිරියට මනා ව විකාශය කොට ඇත. එම ජාතකය කියන අතරතුර ජාතක කතා නාමාවලියක් ඉදිරිපත් කරමින් ඒ ඒ අත් බැව්හි බෝසතුන් දැක්

වූ වික්‍රමයන් සිහිපත් කරව යි. එවැනි තැනෙක්හි දී අසන්නා තුළ ශ්‍රද්ධා භක්තියක් පහළ වීම නො වැලැක්විය හැක්ක කි.

> "මෙසේ හඬමින් සිටි තැනට නිෂ්කරුණ වූ ඒ බමුණු රොද්දා තමා හුණු තැනින් සෙමින් නැගී සිටැ දෙ දන වැලි පිසැ පිසැ ලේ හුණු තැන් බලමින් දෙ වැලමිට නළලේ පිසිමින් පිටිතොල් කමින් වැලක් දෑතින් කඩා හිපැලක් ඇරගෙන යමකු සේ අවුත් වැද ගියේ දරුවෝ වූ දක බයපත් වැ වෙවුලන්නට වන් හ. මෙසේ සිටි දරුවන් හසුකරන කලැ ජාලිය කුමාරයන් ගත දී නැඟෙණියෝ හසු නො වෙති. නැගණියන් හසු වුව ජාලිය කුමාරයා හසු නො වෙති. හසු කොට ගත නො හී රැහැණි ව බෝධිසත්වයන් බල බලා හින්දැ දි දෙබිහින්නත් හසු කොට ගෙන වැලකින් බඳනේ කුමාරයන් දකුණත හා ඒ ළද කුමරිය වමත හා දෑත එක්කොට බැඳ ගෙනැ හිපලින් මර මරා තර ව අල්වා දමමින් යම පල්ලකු සේ ගෙ නැ යන්නට වන්. නැගණියන් පිට හීපල ගැසුව බෑණෝ තමන් ලවා ගනිති. බෑණන් පිට හිපල ගැසුව නැගණියෝ තමන් ලවා ගනිති."[37]

වෙස්සන්තර ජාතක කතා උද්ධෘත පාඨයෙන් කතුවරයාගේ ආඛ්‍යානමය රීතිය පැහැදිලි වේ. අඛණ්ඩ ව සිද්දි ගලා යන ස්වරූපය එහි ජීවි ස්වරූපය රැක ඇත. බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනිත කරවීමෙහි ලා අවශ්‍ය ආඛ්‍යානමය රීතිය බුත්සරණෙහි යොදා ගෙන නැති තරම් ය. යොදා ගැණෙන තැනෙක් දීද ඒ ගෞරවය හිමි වන්නේ බුදුන් වහන්සේ පෙරුම් පිරූ බෝසත් චරිතවලට පමණි. එබැවින් භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා විද්‍යාචක්‍රවර්තීන් ආඛ්‍යානමය රීතිය ගුරු කොට ඇත්තේ ඉතාමත් මඳ වශයෙන් යැයි සැලකීම යුක්ති යුක්ත ය.

## කාව්‍යාත්මක භාෂා භාවිතය.

භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා කතුවරුන් දෙදෙනා ම ඉතා ම ප්‍රබල ලෙස යොදා ගත් භාෂා ප්‍රයෝගය වන්නේ කාව්‍යමය භාෂාව යි. කතුවරයාගේ නිර්මාණ කුසලතාව ප්‍රකට කරවන භාෂා රීතිය ලෙස අවිවාදයෙන් පිළි ගැනෙන්නේ ද කාව්‍යමය භාෂා භාවිතය යි. විවිධ ශෛලීන් අනුගමනය කරමින් තමන් කරනු ලබන සිද්ධි හා අවස්ථා වර්ණනාව මනහර කොට ශබ්දාර්ථ දෙ දෙනාගේ උද්දීපනයට බාධාවක් නො වන සේ කරනු ලබන භාෂා උපයෝගිතාව කාව්‍යමය භාෂා භාවිතය වශයෙන් හඳුනාගනු ලැබේ. එහි විශේෂතා කීපයකින් හඳුනා ගැනීමට පුළුවන.

I විවිධ අලංකාරෝක්තීන් භාවිත කිරීම.

II මාධූර්ය, කාන්ති, අර්ථව්‍යක්ති, ප්‍රසාද, සමතාදී ගුණයන්ගෙන් යුක්ත වීම.

III පුනරුක්ත පද භාවිතය.

IV කර්ණ රසායන ශබ්දාර්ථ යොදා ගැනීම.

V අතිශයෝක්තියත්, පුනරුක්තියත් යොදා ගත් විස්තරාත්මක බව.

VI ගුණ වාචක පද භාවිතය, අනුප්‍රාස පද බහුල ව යොදා ගැනීම.

VII වෘත්තයකට අනුගත වන සේ වර්ණනය ඉදිරිපත් කිරීම.

ශ්‍රව්‍ය හා ශ්‍රවණීය ග්‍රන්ථයන් කෙරෙහි ම මෙම භාෂා භාවිතය එක සේ බලපවත් ව යි. කතුවරයාගේ අභිමතය පරිදි කතාවේ කලාත්මක බවත් මුඛ්‍ය පරමාර්ථය නො බිඳෙන ලෙසත් මෙම රීතිය හසුරුවා ගැනීමට පුළුවන. භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා කතුවරුන් දෙ දෙනාට ම මූලාශ්‍ර ග්‍රන්ථ වූයේ පෙළ පොත් වුව ද එහි අර්ථ රසය උකහාගෙන තම වර්ණනා චාතුර්යයෙන් හරවත් කොට ලියූ කාව්‍යාත්මක බුද්ධස්තෝත්‍ර තත් ග්‍රන්ථයන්ගෙන් දක ගැනීමට පුළුවන. සියත් වියත් බව සම සේ යොදා ගන්නා කතුවරුන්ගෙන් මෙම කාව්‍යාත්මක භාෂා භාවිතය මනා සේ දක ගැනීමට පුළුවන. සංවාද, දෙබස් යොදා ගන්නා විට දී විටෙක නාට්‍යමය ස්වරූපයක් උසුල යි. හාස්‍යය, ශ්‍රද්ධාව, ශෘංගාරය ආදී විවිධ රස ඒ ඒ තැනෙක් හිදි ඇති කරලමින් වණන වැනුමකදී සෞන්දර්යාත්මක වින්දනයක පාඨක, ශ්‍රාවක මනස සංතර්පණය කරන්නට පොහොනා බසක් ලෙස කාව්‍යාත්මක භාෂා භාවිතය හැඳින් වීමට පුළුවන. කතුවරයාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය හෙළි දක්වන කැටපතක් ලෙසින් මෙම නිර්මාණාත්මක, කාව්‍යමය භාෂා උපයෝගිතාව අගය කළ හැකි ය.

කතුවරයන් දෙදෙනාම භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා අදාළ ග්‍රන්ථ තුළින් කාව්‍යාත්මක භාෂා භාවිතය මනා සේ ප්‍රදර්ශනය කොට ඇත. ග්‍රන්ථ තත්ත්වයේ ස්වරූපය කෙබඳු වුව ද රීතියේ ලක්ෂණය කවරක් වුව ද කතුවරුන් දෙදෙනා ම කාව්‍යාත්මක භාෂාවක් උපයෝගි කර ගනිමින් ශ්‍රාවක, පාඨක ජනයා තුළ බුදුන් වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනිත කරවීමෙහිලා උත්සුක වී ඇත. අවස්ථානුකූල ලෙස රස ජනනයෙහිලා ප්‍රස්තුත ග්‍රන්ථ කතුවරුනට උපකාරි වූ අනෙක් රීතියක් නැති තරමට කාව්‍යාත්මක භාෂාව ගුරු කොට ගෙන ඇත.

ධර්මප්‍රදීපිකාව ධර්මයේ ගැඹුරු තැන් විස්තර කළ ද ඇතැම් පදයනට සපයන විස්තරාර්ථය කාව්‍යමය රීතියෙන් රසෝද්දීපනය කරා මෙහෙයවා ඇත. හුදු හෙළ වදන් මෙන් ම උපමාලංකාරාදිය යොදා ගනිමින් කෙරෙන තත් වර්ණනයෙන් බුදුන් වහන්සේගේ රූපකාය සම්පත්තියේත්, ධර්මකාය සම්පත්තියේත්, විවිධ වූ ගුණ සමුදායේත් විශිෂ්ටත්වය මනා ව ධ්වනිත කොට ඇත. ග්‍රන්ථයේ විෂය තත්ත්වය එනම් පරිකථා කරණයට අනුගත ව කතුවරයාගේ වර්ණනා චාතුර්ය, නිර්මාණ කුසලතාව උපයෝගි කර ගනිමින් කෙරෙන එබඳු කාව්‍යාත්මක වර්ණනයක් සිංහල සාහිත්‍යයේ ම දක ගන්නට නො හෙන තරමේ පිරිපුන් සෞන්දර්යාත්මක වර්ණනයන් ධර්මප්‍රදීපිකාවෙන් දක ගැනීමට පුළුවන. " දන්තපුරෙ රාජා හුත්වා" යන පදයට අරුත් සපයන තැනේ දි ගුරුළුගෝමීන් තත් විශද කවිත්වය, රචනා චාතුර්යය, වර්ණනාත්මක රීතිය මනා ව ප්‍රකට කරව යි.

පරිකථා කරණයේ දි සංස්කෘත මිශ්‍ර ගාඪ ශෛලියක් අනුගමය කළ ද ධර්මප්‍රදීපිකා කතුවරයා හුදු හෙළ වදනින් පෝෂිත වූ කාව්‍යාත්මක බසක් යොදා ගත්තේ ය. ඔහුගේ කවිත්වය කියා පාන්නට එම අවස්ථා කීපය ම ප්‍රමාණවත් වේ.

> "ධර්මප්‍රදීපිකාව පුරා ම ගැඹුරු සංස්කෘත වචන මිශ්‍රණයෙන් ගැඹුරු දහම් විස්තර කළ ගුරුළුගෝමීන් මේ කතා වස්තුවේ දි ස්වභාව ධර්මය විස්තර කිරීමට තෝරා ගන්නා ලද්දේ ඉතා මට සිලිටු, මිහිරි ශෛලියක් බව නො කිව මනාය. ගුරුළුගෝමීන්ගේ වර්ණනා ශක්තිය පිළිබිඹු වීමට මේ කතාව ම සෑහේ.

ගුරුළුගෝමීන් ශ්‍රේෂ්ඨ කවියකු වශයෙන් සැලකීමට මෙහි එන වර්ණනාව ප්‍රමාණවත් වේ. ඔහු කවීශ්වරයන් හට කිරීටයක් බඳු වූ හයි කවීශ්වරයන් කී යේ ද මේ වර්ණනා ආදිය නිසා විය යුතු ය."[38]

වික්‍රමසිංහයන්ගේ මේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ධර්මප්‍රදීපිකා කතුවරයා තම ග්‍රන්ථ තත්ත්වයට ගැළපෙන ලෙසින් බස හැසිර වුව ද අවස්ථානුකූල ව එම විග්‍රහාත්මක රීතියෙන් පරිබාහිර ව කාව්‍යාත්මක රීතිය ද ගුරු කොට ගෙන හරවත් තෙදවත් මෙන් ම සරල සෞන්දර්යාත්මක වර්ණනයන්හි යෙදී ඇති බව යි. සුළු කලිඟු දා පුවත සිහියේ තබා ගත් විචාරකයා ගුරුළුගෝමීන්ගේ කවිත්වයෙහි විශදත්වය ප්‍රකට කෙරෙන බුදුගුණ වණන අනෙක් කාව්‍යාත්මක සිද්ධි පිළිබඳ මතකයන් අවධි නො කළ සේ පෙනේ.

"විසිතුරු වැනුම්වලටත් ස්ථානෝචිත මනහර උපමාවලටත් ගුරුළුගෝමී අන් කිසි ලේඛකයකුට දෙවැනි තැනක් නො ගනී. ඔවුන් බොහෝ තැන්වල පාළියෙන් අරුත් පෙරළා ගෙන ඇති බව සමහරු කියති. ඔවුන්ගේ සුළුකලිඟු දා වැනුමෙහි දක්නට ලැබෙන ඇතැම් පාඨ මීට සාධක වශයෙන් දැක්විය හැකි ය. එහෙත් පරිවර්තනය කරන තැන්හි දීත් ඔවුන්ගේ යෙදුමින් හෙළිය වන්නේ අමිශ්‍ර සිංහල ව්‍යවහාරයේ මහිමය ය යි. ඒ පැරණි සිංහලයේ මධුර රසය යි. ඔවුන් කියන දෑයට වඩා රසය ඇත්තේ ඔවුන් කියන සැටියෙහි ය."[39]

ධර්මප්‍රදීපිකාවෙහි ගුරුළුගෝමීන් දැක් වූ වර්ණනාත්මක රීතිය සිංහලයෙහි මධුර රසය හුවා දැක්වීමෙහිලා සමත්කම් ඇති බව පෙන්වන අයුරු එම උද්ධෘත පාඨයෙන් පෙනේ. අමිශ්‍ර සිංහල බසේ අසිරිය හනා වනා දැක් වූ අවස්ථා හා සිද්ධි වර්ණනයෙන් මනා ව පැහැදිලි වේ. පරිකථා සපයන ග්‍රන්ථයක් වුව ද එම දුරවබෝධ පදවල හාත්පස වර්ණනයේ දී කතුවරයා කාව්‍යාත්මක රීතිය උපයෝගි කොට ගත්තේ එමගින් තම පාඨක ජනයාගේ චිත්ත සන්තානය තුළ බුදුන් වහන්සේ කෙරෙහි මෙන් ම බුදුගුණ කෙරෙහි නිරන්තර ශ්‍රද්ධා භක්ති ඉපිද වී ය. මියුරු බස් වහර නිසා පාඨකයා වෙහෙසට පත් නො කර විහිදුවන එම භක්ති රසය ධර්මප්‍රදීපිකාවේ හැම තැනින් ම දිස් නො වේ.

"ධර්මප්‍රදීපිකාවේ බොහෝ සන්ධිස්ථානවල දක්නට ලැබෙන වාක් චිත්‍ර පරීක්ෂා කිරීමෙන් ගුරුළුගෝමීන් පරිකල්පන ශක්තිය මෙහෙය වූ අන්දම ගැන අදහසක් ඇතිකර ගැනීමට පුළුවන...... ගුරුළුගෝමීන් ස්වකීය පරිකල්පනා ශක්තිය නවතාගත් සංකල්ප රූප රාශියක් ම ධර්මප්‍රදීපිකාවෙන් සොයා ගත හැකි ය."[40]

ධර්මප්‍රදීපිකා කතුවරයාගේ කාව්‍යාත්මක භාෂා භාවිතයේ ප්‍රබලත්වය පශ්චාත් කාලීන විචාරකයන්ගේ පැසසුමට ලක් වූ අයුරු ඉහත නිර්වචනය තුළින් හඳුනා ගැනීමට පුළුවන. ධර්ම ග්‍රන්ථයක් ලියුව ද කතුවරයා තම කුසලත්වය ප්‍රකට කරමින් සාමාන්‍ය ජනයා තුළත් විදග්ධ ජනයා තුළත් බුදුන් වහන්සේ කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත වන තරමින් ම තම වර්ණනා චාතුර්ය හැඩ

ගසාගෙන ඇත. වෘත්තයකට අනුගත ව කෙරෙන ඇතැම් පද වර්ණනාවක් තුළින් ධ්වනිත කරන්නේ බුදුන් වහන්සේගේ අතුල්‍ය වූ අසාධාරණ වූ ගුණයන් පිළිබඳ ව යි. වෙහෙසකින් තොර ව එවැනි අවස්ථාවක්, පාඨයක් කියවන පාඨකයා නිතැතින් ම ඒ උතුම් බුද්ධ ගුණයෙහි සිත් පහදවා ගන්නේ වන. සුළුකලිඟු දා පුවත ශෘංගාරාත්මක කාව්‍ය රීතියක් ගුරු කොට ගත්ත ද ඇතැම් පද අරුත් හා විස්තර භක්ති රසයෙන් පිරි ශ්‍රද්ධා දී භාවයන් පූරණය කෙරෙන වර්ණනා වේ.

කාව්‍යාත්මක භාෂා භාවිතය ගුරු කොට ගත් ධර්මප්‍රදීපිකා කතුවරයා දුරවබෝධ පදයන්ට අරුත් සපයමින් බුදුන් වහන්සේගේ අසමසමතා ව වනා එමගින් පාඨක සිත්හි බුදු බැතිය උපදවාලූ අවස්ථා බොහෝය.

> "අභිනීල නෙත්තො යන තන්හි ඔවුන් අභිනීලනේත්‍ර පරිදි කීයේ යැ යත් ? සියලු නුවන් ම නිල් වන්නේ නො වෙයි. නිල් වුවමනා තන්හි දිය මෙරලිය මල් සුදුසු ඉතා පිරිසිදු නිල් පැහැය. රන්වන් වුවමනා තන්හි කිණිහිරි මල් සුදුසු රන්වන් පැහැය. රත් වුවමනා තන්හි බඳුවද මල් සුදුසු රත් පැහැය. සුදු වුවමනා තන්හි දවහත්තරු සුදු පැහැය. කළු වුවමනා තන්හි රුක් පෙණෙල ඇට සුදුසු ඉතා පිරිසිදු කළු පැහැය. නේත්‍ර යුගලයෝ රන් විමනෙක්හි නැගු මිණි සිවු මැඳුරක් සෙයින් වැටහෙති."[41]

බුදුන් වහන්සේගේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණ අතුරෙන් අභිනීල නේත්‍ර පිළිබඳ ව ගුරුළුගෝමීන් වර්ණනා කරන ඉහත පාඨය කාව්‍යාත්මක ගුණයෙන් පරිපෝෂිත ය. හුදු හෙළ වදන් පමණක් ම යොදා ගනිමින් උපමාලංකාරයෙන් සරසා ශබ්දාර්ථයන්හි බාධා නො පමුණුවමින් කරන එම වර්ණනය කාගේ වුව ද චිත්ත සන්තානය තුළ අත්‍යුත්තම බුද්ධකායයෙහි ශ්‍රද්ධා භක්තිය ජනිත කරව යි.

වර්ණනයෙහි හා කථනයෙහි දි ධර්මප්‍රදීපිකා කතුවරයා අමිශ්‍ර සිංහලය යොදා ගත් සැටි ඒ වැනුම් නියරෙන් පැහැදිලි වේ. සොබා දම් අසිරියෙන් ලත් සියත් බව ඇති කතුවරයා ආලංකාරිකයන්ගේ න්‍යායයෙන් ලත් වියත්කම් ඇති කතුවරයා තම පාණ්ඩිත්‍යයත්, ජීවන අත්දැකීමත්, වර්ණනා චාතුර්යයත් සම සම ව යොදා ගනිමින් කළ එම වර්ණනාවෙන් පාඨකයා තුළ තමන් අභිමත අරමුණු මුදුන් පමුණුවා ලීමෙහි අතිශය සාර්ථකත්වයත් ලබාගෙන ඇති බව පෙනේ. බුදුන් වහන්සේගේ රූපකාය සම්පත්තිය වර්ණනා කරන කතුවරයා එහි දි හුදු හෙළ බසෙහි තරම ප්‍රයෝජනයට ගත් සැටි සුවිශේෂ ය. එම අවස්ථාව කියවන අසන තැනැත්තා නිතැතින් ම බුදු සිරුරෙහි අත්‍යුත්තම රූප ශෝභාවෙන් කුල්මත් වෙයි. සමාධි හා ප්‍රසාද ගුණයෙන් ද සිලෙසිනා ගුණයෙන් ද පරිපූර්ණ වූ තත් වර්ණනා පාඨය අර්ථෝද්දීපනයට ද බාධාවක් නො වේ. ග්‍රන්ථයකට ඇවැසි වර්ණනාත්මක, සෞන්දර්යාත්මක වර්ණනයක ලක්ෂණ එහි අන්තර්ගත ය.

"බ්‍රහ්මුජ්ජුගත්තො" යන පදයට අරුත් සපයන කතුවරයා උපමාලංකාරාදිය යොදා ගනිමින් බුදුන් වහන්සේගේ රූපකාය සම්පත්තිය වැනුමට කාව්‍යාත්මක බස හසුරුවා ගන්නේ මෙසේ ය.

"බුදුනට වූ කල ඍජුවැ උද්ගත වූ ශරීරය දෙව් නුවර නැඟු රන් තොරණක් සෙයින් ශෝභිත යැ"[42]

එසේම,

"උණ්ණා හමුකන්තරෙ ජාතා" යන්නෙහි ඒ ලොම් නළල් මැද වූයේ ය. ඉතා පිරිසිදු දවහත් තරු වැන්න. පහන් ගිතෙල ගලා තුබූ සියක් වට පෙළු පුළුන් පෙදක් සෙයින් මෙළෙකැ. හිඹුල් පුලුන් ලිය පුලුන් හා සමාන යැ. .... ගගන තලයෙහි ඔසධි තාරකා සෙයින් අති මනෝහර වැ දිස්ති."[43]

බුදුන් වහන්සේගේ සිරුර සැරසූ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන් ගැන ධර්මප්‍රදීපිකා කතුවරයා වර්ණනාත්මක භාෂාවක් ආශ්‍රය කර ගනිමින් වණන එම වැනුම් මගින් නිරායාසයෙන් ම ජනතාව තුළ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනිත කරවීමෙහි පොහොනේ ය. අමිශ්‍ර සිංහල භාෂාව යොදා ගැණුනු එබඳු කාව්‍යාත්මක වර්ණනා ධර්මප්‍රදීපිකාවෙන් තැන තැන හමු වුව ද ඒ සියල්ල උද්ධෘත කොට දැක්වීම අභිප්‍රේතාර්ථ සාධනයෙහිලා උපකාරී නො වේ.

බුදුන් වහන්සේ ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමෙන් සක්වල ම අග්‍ර වූ අයුරු ඉහත පරිච්ඡේදයක දී සාකච්ඡා කෙරිණ. කාව්‍යාත්මක බස යොදා ගනිමින් ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේ දී ඒ අද්විතීය අසිරිසිරි සහිත යමක ප්‍රාතිහාර්ය මෙසේ වර්ණනාවට හසුකර ගන්නේ ය.

"සකල ශරීරයෙන් රන්රස දහරා සෙයින් පාදපාණි තලයෙන් හා ඔස්ඨයෙන් පබල රස දහරා සෙයින් උණුලොම් ධයින් හා දසන් පෙළ නිය පෙළින් රිදී රස දහරා සෙයින් තල්කඳ සා රථසක් සා කුළාරගේ සා රස් කළඹණු නික්ම දෙව්දුනු දහස් සඳ දහස් හිරු දහස් නැඟී කල් සෙයින් දසනු දස දල්වමින් අනේක ලෝකධාතු ඒකාලෝක කෙරෙමින් නික්මුණු හු. මෙසේ නිල් මහනෙල් දම් සෙයින්, නන් රුවන් දම් සෙයින් බඳුවද මල්දම් සෙයින්, මලිගිය මල්දම් සෙයින්, නන් රුවන් දම් සෙයින් දසදෙසෙහි දිවෙන සවනක් රස්"[44]

පුනරුක්ත පද භාවිතය මෙන් ම තත්සම පද භාවිත කරගෙන කතුවරයා බුදුන් වහන්සේගේ ඒ අසිරිමත් යමක ප්‍රාතිහාර්යයේ විචිත්‍රත්වය වැනූ අයුරු පාඨකයාගේ හා ශ්‍රාවකයාගේ මුවඟට සාදුකාර නංවන සුළු ය. හාත්පස පරිසරයෙන් එකතු කරගත් උපමාලංකාරාදියෙන් පෝෂිතය. උපමා භාවිතයේ දී ද මාලෝපමා භාවිත කර ගෙන ඇත. අසා සිටින්නට ප්‍රිය උපදවන කර්ණ රසායන ශබ්දාර්ථයන්ගෙන් පරිපෝෂිත කොට යෙදූ ඒ කාව්‍යාත්මක බස අසන කියවන කාහට වුව ද අතුල්‍ය වූ බුද්ධ ගුණයන් කෙරෙහි සිත් අලව යි. බුදු බැතිය, බුදු ගෞරවය වඩව යි. ග්‍රන්ථ රචක යුගයේ උත්කර්ෂවත් ලෙසින් වැනූ ඊශ්වර නිර්මාණවාදී මැවුම් කරුවන්ට අභියෝගාත්මක වූ ද යථාර්ථවාදී වූ ද මෙවැනි වැනුම් මගකින් කතුවරයා අරමුණු කර ගත් අභිප්‍රේතාර්ථයන් මුදුන් පත් කරමින් දන දන මුවගෙහි සාදු කාර හඬ දෙමින් බුදුන් වහන්සේ කෙරෙහි බුද්ධාලම්බන ප්‍රීතිය වඩවා ලන්නට සමත් වෙනත් භාෂා ප්‍රයෝගයක් නැති තරම් ය. සංකල්ප රූප පාඨකයා සිත්හි මවාලමින් වර්ණනා කරන ඒ

උතුම් බුද්ධ විෂයෙහි විපුලත්වය සිහියට නගා ගන්නා ජනයා මෙවැනි විකුම් පාන්නට අන් කෙනෙකුන් කවරෙක් දැයි සිතමින් බුදුන් වහන්සේ සරණ යනු නො අනුමාන ය.

භාෂාත්මක අතින් ගත් කල්හි පුනරුක්ත පද භාවිතය. උපමාදී අලංකාර භාවිතය, තත්සම පද භාවිතය, හා හුදු හෙළ වදන් භාවිත කිරීම විශේෂයෙන් තත් වර්ණනා පාඨයෙන් දක ගැනීමට පුළුවන. පරිකථා ග්‍රන්ථයක් වුව ද ධර්මප්‍රදීපිකාවේ පැණෙන මේ වර්ණනාත්මක භාෂාව භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා අතිශයෝපකාරි වී ඇත.

"මෙහි පස් ඇස් නම් කවරයත්" යන තැනේ දි කතුවරයා වර්ණනාත්මක රීතිය උපයෝගි කර ගනිමින් අනෙකක්හට නො වන බුදුන් වහන්සේට පමණක් උරුම වූ චක්ෂු යුග්මය වර්ණනා කරන්නේ මෙසේ ය.

> "එහි මසැස පස් පෑ දිස්සී නිල් පැහැයැ, රන්වන් පැහැයැ, රත් පැහැයැ, කළු පැහැයැ, සුදු පැහැය යයි එහි යම් තැනෙක අක්ෂිරෝම පිහිටියේ ද එතන්හි දිය මෙරලිය මල් සුදුසු සිනිඳු පිරිසිදු නිල් පැහැය. ඒ ඉක්බිති කිණිහිරි මල් සුදුසු සිනිඳු පිරිසිදු රන්වන් පැහැය. ඒ ඉක්බිති රතිඳු ගොව් සුදුසු සිනිඳු පිරිසිදු රත් පැහැයැ. මධ්‍යයෙහි රුක් පෙණෙල ඇට සුදුසු සිනිදු පිරිසුදු කළු පැහැය. ඒ වටා දවහත්තරු සුදුසු සිනිදු පිරිසිදු සුදු පැහැය."[45]

උපමාදී අලංකාරයෙන් අලංකාර කොට අතිශයෝක්ති වර්ණනයට නැඹුරු වූ ළයාන්විත වෘත්තයකට සමීප වූ මේ වර්ණනයෙන් ද බුදුන් වහන්සේගේ රූපකාය සම්පත්තියේ විශේෂත්වය පැවසී ය. මෙවැනි වැනුමක් හුදෙක් කතුවරයාගේ වර්ණනා චාතුර්යය පමණක් ම විශද නො කර අභිමත පරමාර්ථ සාධනයෙහිලා ද උපකාරි වෙයි.

> "මෙසේ තුන් මලක් එක් මලක් පහන් සිතින් බුදුනට පිදූයෙහි ඵල අනන්ත වීයැ. එබැවින් එදවස් රම්‍ය පුරවැසියන් කළතාක් බුද්ධ පූජායෙහි ඵල ද දැන් මේ වත්මනුයෙහි සැදැහැ ඇතියවුන් තුනුරුවන් හි පැහැද කරන තාක් පූජායෙහි ඵල ද කිනම් කියනුවග ?"[46]

දානයෙහි ආනිසංස කියා පෑමට හුදු හෙළ වදන් භාවිත කර ගත් අයුරු එයින් පෙනේ. එමතුදු නො ව කතුවරයා එම වර්ණනා මාර්ගයෙන් තුනුරුවන් කෙරෙහි පැහැදි කරන්නා වූ පූජාවෙහි ඵලයන්ගේ අනුසස් විස්තර කොට දක්විය නො හැකි යැයි දක්වමින් ජනයා ඒ පූජාවන් කෙරෙහි ශ්‍රද්ධාතිශය කරවීමෙහිලා උත්සුක වී ඇත.

> "මෙසෙයින් පිනිබිඳට මහමුහුදු සේ තල්පත් බොලට මහ පොළොව බොල් සේ මොනරහකුරට සුනෙර සේ හබ බිජුකුසට අහස් කුස් සේ කදෝපනනට සත්හිරු ප්‍රභා සේ සව් පසේ බුදු විෂයට ද දුරින් දුරු වූ බුදුගුණ පුහුදුන් ලෙව් කිසේ දන්නැ.

කිහිඹිනට සුනෙර ගොදුරු සෙයින් මැ පුහුදුන් විෂයට කිසේ විෂය වන්නැ. මෙසේ බුදුහු අනන්තාපරිමාණ ගුණ ඇතියො"[47]

වර්ණනාත්මක වූ පරිපූර්ණ භාෂාවක් යොදා ගනිමින් ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේ දි බුදුරුව, බුදුගුණ, බුදුබණ වනා ශ්‍රාවකයා හා පාඨකයා තුළ ශ්‍රද්ධා භක්ති සංවර්ධනයෙහිලා තම රචනා රීතිය මෙහෙයවා ඇත. ග්‍රන්ථ තත්ත්වය පරිකථා වුව ද ලත් විටෙක තම විචාර පූර්වක කවි සංකල්පනාවෙන් හා පරිකල්පනා ශක්තියෙන් අනූන කොට පබැඳි මෙවැනි වැනුම් තුළින් නිරන්තරයෙන් ම ජනතාව තුඩ තුඩ බුදුගුණ මහිමෙක වරුන රැව් දෙමින් ශ්‍රද්ධාව භක්තිය හා බුදුන් වහන්සේ විෂයෙහි අපරිමාණ ගෞරවය ජනිත වන්නේ යැයි පවසතොත් එය අතිශයෝක්තියක් නො වේ. ඒ තරමට ම ගුරුළුගෝමීන් ඒ සඳහා කාව්‍යමය භාෂාව හසුරුවා ගත්තේ ය.

අමාවතුර රචනා කිරීමේදි ද ගුරුළුගෝමීන් කාව්‍යාත්මක භාෂාව ගුරු කොට ගනිමින් අවස්ථා හා සිද්ධි වර්ණනා කොට හුදී ජනයාගේ පහන් සංවේගයත්, බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්තියත් ජනිත කරවීමට ගත් උත්සාහය දක ගැනීමට පුළුවන. පාලි භාෂාවට සමීප ව ඇසුරු කරමින් හුදු හෙළ වදන් භාවිත කරමින් කරන එම වර්ණනා ද කතුවරයාගේ සැකෙවි රීතියට ම අනුගත කොට ඇත.

> "කවිත්වයෙන් මෙන් විශාරද ග්‍රන්ථ ඥානයෙන් ද සකස් වුණු බුද්ධියෙන් යුතු චින්තකයෙකු වූ ගුරුළුගෝමීහු අතින් නිරන්තරයෙන් ම හැඩ ගැසුණු නෛසර්ගික වාග් ව්‍යවහාරයකි අමාවතුරෙහි දක්නා ලැබෙන්නේ."[48]

මාර්ටින් වික්‍රමසිංහ ශූරින්ගේ මෙම ප්‍රකාශය අමාවතුර කතුවරයාගේ කාව්‍යාත්මක භාෂාව විවරණය කෙරෙයි. තැනට සුදුසු පද තෝරාගත් කතුවරයා ශ්‍රාවකයා වෙහෙසට පත් නො කරන වර්ණනා චාතුර්යයකින් බුද්ධ චරිතය විස්තර කළේය. අලංකාරාදිය යොදා ගත්ත ද දීර්ඝ විස්තර අමාවතුරෙන් හමු නො වේ. කතුවරයාට අභිමත පරිදි විස්තරාර්ථ කථනයට බර වූ අතිශයෝක්ති භාවිතයෙන් යුක්ත ව තම රචනය සරසා ගත හැකි වුවත් කතුවරයා එමගට පිළිපන්නේ නො වේ. ඒ එසේ වුව ද ගත් රීතියේ සැකෙවි භාවයෙන් ම ශ්‍රාවකයා තුළ බුදු බැතිය වර්ධනය කරවීමෙහිලා පසුගාමී බවක් නම් දක්වා නැත.

අන්තර්ගතයේ මෙන් ම භාෂා ව්‍යවහාරයේ සංක්ෂිප්තතාව නිසා අමාවතුරෙහි දි බුදුන් වහන්සේගේ චරිතයෙහි, ධර්මයෙහි, ඍද්ධි ප්‍රාතිහාර්ය බලයෙහි තරම අතිශයෝක්ති වර්ණනාවකින් තොර ව අඛණ්ඩ ව සිද්ධි ගලා යාමකට ඉඩ සලසමින් වර්ණනා කොට ඇත.

> "අමාවතුර සිංහල සාහිත්‍ය ප්‍රේමීන්ගේ සැලකිල්ලට භාජනය වූයේ එය බුදුන් වහන්සේගේ ගුණ කියවෙන අමා දහරක් වන නිසා ම නො වේ. බුදුන්ගේ ගුණ මහිමය විසිතුරුවට දක්වෙන අන්‍ය සිංහල ග්‍රන්ථ රාශියක් ඇති බැවිනි. එහෙත් මෙහි බුදුගුණ කියැවෙන්නේ අන්‍ය ග්‍රන්ථවල දැක්වෙනවාට වඩා වෙනස් ලෙසකිනි. ඒ

බුදුගුණ කියන සැටියෙන් ම අමාවතුරු කතුවරයාන්ගේ අසදෘශ රචනා ශක්තිය වටහා ගත හැකි වේ."[49]

කතුවරයා තම අසහාය කවි චින්තනය මෙහෙයවා බුදුගුණ වැනූ අයුරු එම විවේචනයෙන් පෙනේ. බුදුගුණ වැනුමෙහි දී විසිතුරු වැනුම් මග ගත් බව ද එමගින් ප්‍රකාශිත ය. විසිතුරු කොට බුදුගුණ වනන්නේ අසන්නා තුළ කියවන්නා තුළ බුදුබැතිය හා බුද්ධාලම්බන ප්‍රීතිය ජනිත කරවීමට යි. ගැදි කවි මගින් අමාවතුර කතුවරයා ඒ අරමුණු ඉටුකර ගෙන ඇති බවක් පෙනේ.

"හුදු හෙළ බසට කතුවරයා මහත් සේ ප්‍රිය කළ අයුරු පෙනේ. සිංහල භාෂාවේ සැඟවී තුබූ ව්‍යක්ත ස්වරූපය, ප්‍රාණවත් භාවය, රසාවහ ගුණය ගුරුළුගෝමීන්ගේ නිර්මාණ කෞශල්‍යය නැමති පර්යේෂණාගාරය තුළ දී නිසි ලෙස සකස් වී සජීවී භාෂාවක් ලෙස බිහි වූ අයුරු අමාවතුරින් පිළිබිඹු වේ."[50]

සිංහල භාෂාවේ ප්‍රාණවත් සජීවී ගුණය යොදා ගෙන කතුවරයා වර්ණනාවට හසු කරගත් වස්තු විෂය නම් බුද්ධ චරිතය යි. බුද්ධ චරිතයේ කැපී පෙණෙන "පුරිස දම්ම සාරථී" ගුණය තුළින් බුදුන් වහන්සේගේ දේශනා විලාසය හා ඍද්ධි ප්‍රාතිහාර්ය ගුණ මහිමය ප්‍රකට කෙරේ. එබඳු වස්තු විෂයක් කතුවරයකුගේ නිර්මාණ කුසලතාව විදහා පාමින් වර්ණනා කරන විට තත් ග්‍රන්ථ පරිශීලනය කරන්නන් තුළ නිරන්තරයෙන් ම බුදුන් වහන්සේගේ අසමසම ගුණාංගයන් පිළිබඳ සිත් ඇදී යයි. එවිතරෙක් ද නො ව උන් වහන්සේ කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත ශ්‍රද්ධාධ්‍යාසය ද ඇතිකර ගනී. වැරැදි දෘෂ්ටියෙහි වූවෝ එමගින් මිදෙති. එබඳු වැනුමක් අමාවතුරෙන් ධ්වනිත වන්නේ නම් ඒ සැකෙවි රීතිය තුළ පැවති කාව්‍යාත්මක භාෂා උපයෝගිතාව නිසා ය.

අමාවතුරෙහි ස්වසන්තාන නම් දමන කතාවේ දි සිදුහත් බෝසතාණන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධි වෘක්ෂයට පිට දී බුදු වී මිසක නො නැගිටිමි යි අදිටන් කොට වැඩ සිටි අවස්ථාව ඉතාමත් රමණීය අයුරෙන් වර්ණනාවට ලක්කොට ඇත.

"සුයාම නම් දෙව්රජ තුන් ගව්වක් පමණ විල්දුනා ගෙණැ සලමින් සිටියේ ය. සන්තුසිත නම් දෙව්රජ මිණිතල්වැට ගෙණැ සලමින් සිටියේ ය. මහබඹ පුන් සඳක් බඳු සේසත් වඩා සිටියේ ය. දෙතිස් දෙව් කුමරියෝ දිව කුසුම් පිරුණු රුවන් සුමගු ගෙණැ පුදමින් සිටියා හ. සියලු දස දහසක් සක්වල දෙවියෝ සණ වෙස් ගෙණැ හාත් පස්හි දද පෙළ කෙහෙල් පෙළ තොරණ පෙළ මල්දම් පෙළ පුන්කලස් පෙළ ......"[51]

නිර්මාණවාදි සංකල්පනාවන් ගත්තවුන්ට සිදුහත් බෝසතුන්ගේ පවා මහාත්මයය අවබෝධ කරවන අයුරු එවැනුම් මගෙහි අන්තර්ගත ය. එහි සුඛනම්‍ය භාෂා භාවිතයක් යොදා ගෙන ඇත. අරුත් දනවීමෙහි හා කර්ණ රසායන ශබ්ද මාධූර්යයෙන් ද තෙදවත් වී ඇත. පුනරුක්ත පද භාවිතය

අපේක්ෂා කළ නො හැකිය. තවද එම වර්ණනාත්මක අවස්ථාවන් බුදුගුණ හා බැඳී පවතියි. කෙසේ වතුදු ලත් විටෙක කෙටියෙන් මුත් යොදා ගත් කාව්‍යමය භාෂා රීතියෙන් කතුවරයා පාඨකයා හා ශ්‍රාවකයා තුළ බුදු බැතිය, බුදු ගෞරවය ජනිත කරවීමටත්, ජනිත ව තිබූ තත් භාවමය සංකල්පයන් වර්ධනය කරවීමටත් සංක්ෂිප්ත වූ කාව්‍යමය බසක් දෙතුන් පලක හෝ යොදා ගෙන ඇති සැටියක් දැක ගත හැකි ය.

භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා කාව්‍යාත්මක භාෂා උපයෝගිතාව ප්‍රබල මාධ්‍ය කරගත් ලේඛකයා විද්‍යාචක්‍රවර්තීන් ය. කිවයුතු දේ අලංකාරයෙන් භූෂණය කොට වර්ණනයෙන් අතිශයෝක්ති කොට, පුනරුක්තියෙන් පුනරුක්ත කොට ශබ්ද රසයෙන් අනූන කොට, අර්ථ රසයට හානි නො කරමින් කාව්‍යාත්මක ව බුදුගුණ වැනූ ලේඛකයන් අතර ප්‍රමුඛතමයා බුත්සරණ කතුවරයා ය. අනුප්‍රාසවත් අක්ෂරයන් මෙන් ම පද ද උපයෝගි කර ගනිමින් සෞන්දර්යාත්මක ව අවස්ථාවන් හා සිද්ධි වනමින් බුදුගුණ කියූ සැටියකුයි බුත්සරණින් දිස් වන්නේ. කතාවක් ආරම්භ කරන්නේ ද ඉදිරිපත් කරන්නේ ද අනුපිළිවෙළකට නො ව භාවයන් උද්දීපනය කෙරෙන තැනින් ය. එමගින් කතුවරයා නිතැතින් බුදුගුණයෙහි මහිමය වැනී ය.

ව්‍යක්ත විශාරද ධර්ම දේශකයාණ කෙනෙකු පුරාණෝක්තිය ද උපයෝගි කර ගනිමින් පහදා දෙන බණක මෙන් විද්‍යාචක්‍රවර්තීන් බුදුගුණයෙහි අසිරිය නැවත නැවතත් පහදා දුන්නේ ය. විචිත්‍ර වර්ණනයට කතුවරයා තුළ තිබූ අභිලාසය බුත්සරණින් නො මද ව පෙනේ. වෘත්තයකට අනුගත කෙරෙමින් ගුණ වාචක පද භාවිත කෙරෙමින් වනන බුදු ගුණයෙහි ශ්‍රද්ධාතිශය ඇති කරයි.

> "බුත්සරණ භාෂාව අමාවතුර භාෂාවට වඩා ශිථිල ය. කොමළ ය. සුලලිත ය. අනුප්‍රාස රසයෙන් යුක්ත ය. .... බුත්සරණෙහි පිටක් පාසා දක්නට ලැබෙන මේ වාග් ප්‍රපංචය සුලභ කවිත්වයෙහි මිස දුර්ලභ කවිත්වයක ලක්ෂණ නො හඳුන්ව යි."[54]

කතුවරයාගේ වස්තු විෂය බුද්ධ චරිතය යි. ඒ බුද්ධ චරිතය වැනීමේ දි යොදා ගත් භාෂාව කාව්‍යාත්මක ය. අශිථිල නො වූ සරල බසක් අනුප්‍රාසයෙන් ගීතවක් කොට වණන බුදු ගුණයෙහි සැදැහැ සිත් නො වඩවන්නේ යැයි කා හට නම් තර්ක කළ හැකි ද? ඔහුගේ එම ගීතවත් වර්ණනයෙහි දක්නට ලැබෙන්නේ කාව්‍යාත්මක බස් වහර යි. එය භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා බෙහෙවින් උපකාරි ය.

> "බුත්සරණ ගද්‍යකාව්‍ය ස්වරූපයක් උසුල යි. කාව්‍ය ගණයෙහිලා සැලකිය හැකි ගද්‍යයෙන් ලියවුණු ඕනෑ ම රචනයක් ගද්‍ය කාව්‍යයක් වශයෙන් ගිණිය හැකි වුව ද බුත්සරණ සිංහලයේ අන්‍ය ගද්‍ය කාව්‍යයන්ගෙන් වෙන් කරන ලක්ෂණ ද වේ. ගද්‍යයෙන් ලියන ලද වුව ද වෘත්තයකට අයත් ලක්ෂණ එහි ඇත. ...... උපමා යෙදීමේ දස්කම බුත්සරණ කතුවරයාගේ කවිත්වයෙහි විශේෂාංගය කි. ඔහු උපමා යොදන්නේ අදහස් පැහැදිලි කරනු සඳහා පමණක් නො ව හැඟීම් අවුස්සනු සඳහා ද වේ."[55]

සිංහලයේ අන්‍ය ගද්‍ය කාව්‍යයන්ට වඩා බුත්සරණ විශේෂත්වයක් ගනු ලබන්නේ එහි යොදා ගත් වාග් රිද්මය පද්‍යයක ඇතුළත් වෘත්තයක ලක්ෂණ ගන්නා නිසාවෙනි. ඇද පැද කියවිය හැකි අයුරෙන් බුදුගුණ වනමින් කතුවරයා ධර්ම දේශකයකුගේ මාර්ගය ගත්තේ ද විය. අසා සිටින්නන්ට එහි අර්ථ ග්‍රහණය අපහසු ද නො වේ.

කවිකමෙන් ගැදි ආර පෝෂණය කළ විදූසක්විතීන්ගේ ප්‍රතිභාන ශක්තිය බුත්සරණින් මනා ව විශද කෙරේ. තෙරුවන් කෙරෙහි නිති ශ්‍රද්ධාධ්‍යාසය වඩවමින් රචිත බුත්සරණෙහි ඇතැම් වැනුමක් අතිශයෝක්ති වර්ණනය නිසා ම බුද්ධ භාෂිතය ද ඉක්මවා යන අයුරක් මෙන් පෙනේ. එවැනි යෙදුම් බුදුන් වහන්සේට උපන් අගෞරවයකින් නොව ළෙහි හටගත් ගෞරවය නිසාවෙනි.

> "විද්‍යාචක්‍රවර්තීන්ගේ ප්‍රතිභාන ශක්තිය මේ උපමාවන් ගෙන් ම පැහැදිලි වෙයි. කෙසේ වෙතත් භක්තියෙන් ම ඔද වැඩී ගිය සිත් ඇති විද්‍යාචක්‍රවර්ති ඇතැම් තැන්හි ඒ භක්තිය නිසා කී දෙය බුදුන් වහන්සේ දෙසූ විචාර බුද්ධියෙන් ද පිට පනින බව පෙනේ. .... බුත්සරණේ එන වෙස්සන්තර ජාතකය විද්‍යාචක්‍රවර්තීන්ගේ රචනා ශක්තිය මෙන් ම වර්ණනා ශක්තියත් ප්‍රතිභාන බලයත් ඒ ඒ හැඟීම් අවුස්සමින් කථා කීමෙහි සමර්ථ කමත් හෙළි කරන කථා වස්තුවකි."[56]

කතුවරයා එවැනි වැනුම් මගක් අනුගමනය කළේ හැකිතාක් දුරට ප්‍රසාද ගුණයෙන් යුක්ත ව බුදුගුණ වනා එමගින් පාඨක සිත්හි බුදු බැතිය වඩවා ලීමට යි. එවැනි වැනුම් නියර සාමාන්‍ය ජනතාවගේ ළෙහි නිරන්තරයෙන් ම බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයක් හා භක්තියක් ජනිත කරව යි.

බුත්සරණ කතුවරයාගේ කාව්‍යාත්මක භාෂාව නිතැතින් ම ජනයා තුළ භක්තිය හා ගෞරවය ඇති කිරීමෙහිලා බෙහෙවින් උපකාරි වේ. හඳ දෙස බලා හඬන ළදරුවෙකු සේ ඔහු බුදු ගුණයෙහි ඇළුම් කොට වර්ණනා කළේ ය. කෙතෙක් බුදුගුණ ගැයුව ද එයින් සෑහීමකට පත් නො වූ අයුරක් ඇතැම් තැනක දි කතුවරයාගේ ප්‍රකාශයෙන් ම ධ්වනිත කොට දක්වයි. කතුවරයාගේ මේ කාව්‍යාත්මක භාෂා ප්‍රයෝගය හුදෙක් ම අසන්නන් විඩාවට පත් නො කර බුදු ගුණයෙහි ඇලුම් ඇත්තන් කරවීම සඳහා බව හැඟේ. පාලි, සකු භාෂා මෙන් ම විෂයාන්තර දැනුම ද බුත්සරණෙහි ම තැන තැන දක ගත හැකි ය. එ නමුදු ඔහු ඉතා සරල හා ලයාන්විත බසකින් බුදුගුණ වැනුවේ අසන්නා ද ඒ උතුම් බුදු ගුණයෙහි පහදවන අටියෙනි.

> "තුරු අගක රැව් දෙන මත් කොවුලෙකු සේ බුදුගුණ රසයෙන් මත් ව සිතට නැගුණු අන්දමින් විද්‍යාචක්‍රවර්තීන් කළ බුද්ධාභිවාදනය කියවන්නාට නො අඩුව රස විඳිය හැකි සේ ලියැවී තිබීම නිසා පොදු මහජනප්‍රියත්වය බුත්සරණට ලැබී ඇත."[57]

බුත්සරණෙහි රචනා විලාසය මෙමගින් කීවේවන. ළයාන්විත වෘත්තයක විසිතුරු වැනුම් මගකින් බුදුගුණයෙහි තර ම කීවා පමණක් නො ව අන්‍යයන් ද එ මගට අවනත ව අනුගත වෙනවා දැකීම කතුවරයාගේ පරමාර්ථය ද විය. එයට උචිත බස් වහර කාව්‍යාත්මක ව යොදා ගත්තේ විය.

> "ශ්‍රද්ධාව භක්තිය දනවෙන අයුරෙන් බස උපයෝගි කර ගැනීම දක්ෂ ධර්ම දේශකයන්ගේ සිරිත වෙයි. ඒ අනුව යමින් විද්‍යාචක්‍රවර්තීන් තම රීතිය සකස් කර ගනි. ඔහු තම කවිත්වයෙන් එම දේශනා ශෛලිය ගද්‍ය කාව්‍යයකට උචිත රීතියකට පෙරළා ගනී. ඇතැම් විට එය ගද්‍ය ස්වරූපය ද ඉක්මවා යමින් පද්‍ය ස්වරූපය වැළඳ ගනී."[58]

ජනයාගේ මනෝ භාවයන් රසඥතාවට පත් කරලමින් විද්‍යාචක්‍රවර්තීන් මනහර වූ වර්ණනාත්මක වූ කාව්‍යමය වූ ළයාන්විත වූ බස යෙදුමකින් බුදුන් වහන්සේගේ ගුණ ගායනය කළේ ය. බුදුන් වහන්සේගේ හා ධර්මයේ, ගුණ සමුදාය පිළිබඳ ව පාඨක ජනතාවගේ හද තුළ නිරන්තර ශ්‍රද්ධාව හා භක්තිය ජනිතවන අයුරෙන් කීවා වූ ඒ ගද්‍ය රීතියේ ස්වරූපය පද්‍ය රීතියට ද සමීප වෙයි. හුදු හෙළ වදන් පමණක් යොදා ගත් කාව්‍යමය වර්ණනා ද පාලි සකු තත්සම පද යොදා ගත් කාව්‍යමය වර්ණනා ද බුත්සරණින් දැක ගැනීමට පුළුවන. ධර්ම දේශකයාණන් වහන්සේ නමකගෙන් අසන්නට ප්‍රිය උපදවන සුලලිත රීතියකින් හඬ නගා ශබ්ද මාධූර්යයෙන් කෙරෙන සුමුදුර ධර්ම දේශනාවක් ලෙසින් විද්‍යාචක්‍රවර්තීන් කාව්‍යාත්මක භාෂාවක් උපයෝගි කර ගනිමින් බුදුගුණ වනා පාඨකයා තුළ නිරන්තර ශ්‍රද්ධා භක්ති ජනිත කරවී ය.

බුත්සරණ ග්‍රන්ථය පුරා ම යට දැක් වූ කාව්‍යාත්මක භාෂා ප්‍රයෝගයෙන් අලංකෘත වූ වර්ණනයන් දැක ගැනීමට පුළුවන.

උපමාලංකාරාදිය යොදා ගනිමින් "බුද්ධ රශ්මි" පිළිබඳ ව අන්‍යයන් හද තුළ ශ්‍රද්ධාතිශය වඩවමින් කළ වැණුම මෙසේ ය.

> "සක්වල ගල මැඬගෙන, අකනිටා බඹලොව පැහැගෙන මහ පොළොව ඉක් ම ගෙනැ දිවනා සවණක් රැසින් මුළුලොව ගැලෙන්නට වන. මුළු ලොව කසමල් කැනින් වසන්නා සේ දිය මෙරලිය මලින් නවහම් කරන්නා සේ, මොනර පිළින් සදන්නා සේ, ඉඳුනිල් මැණිකින් අතුරන්නා සේ, නිල්රස් කඳෙක් එක් ලක්ෂ සූසැට දහස් යොදුන් සක්වලගල හිස පැහැගෙනැ ඉතිරැ දිවෙන්නට වන..... දවහත් තරු සේ රිදී රස ධාරා සිය දහස් සේ, සරත් වලා කැල සිය දහස් සේ සුදු බුදු සේ කඳ දිවෙමින්"[59]

සවනක් ගණ බුදු රැසින් ලොව ඒකාලෝක කළ අයුරු ඉතා විසිතුරු ව අලංකාර ව කියා ඇත. අසන්නන් සිත තුළ විසිතුරු බුදුරුවක් මවා පාමින් සවනක් බුදු රැසින් දිලිහි දිලිහී වැඩ හිඳින

බුදු කෙනෙකුන් චිත්‍රණය කොට කෙරෙන එම වර්ණනයෙන් අතිශයින් ම ශ්‍රද්ධා භක්ති උපදවන්නේ ය.

බුදුරුවත් ධර්මයත් එකවට වැනුමට ගනිමින් පාඨකයා සිත් ගෞරවයෙන් පුරවාලන වර්ණනා බුත්සරණෙහි එමට ය.

> "අතුරු සිදුරු නැති ව පුරාගෙන සිටි බුදු පිරිස දොහොත් මුදුනෙහි තබාගෙන සාදුකාර දෙන්නට වන් කල්හි දස දහසක් සක්වල දෙවි බඹුන් ආකාශය පුරා බුද්ධ ශ්‍රී බලම්හයි සැරැහී සිටගත් කල්හි... මහ වතුරක් සේ එක පැහැර බුදු රස් එදොරින් නික්මැ මුළු ලොව වසන්නට වන් කල්හි හුදු අමායෙන් මවා ලූ රුවක් සේ හුදු විස්මයෙන් මවා ලූ රුවක් සේ, හුදු මෛත්‍රියෙන් මවා ලූ රුවක් සේ, හුදු කරුණායෙන් මවා ලූ රුවක් සේ, හුදු මුදිතායෙන් මවා ලූ රුවක් සේ,....."[60]

බුදුන් වහන්සේගේ ශ්‍රී රූපකාය උපමායෙන් වර්ණනා කරන කතුවරයා එම උපමාව සඳහා යොදා ගන්නේ ද ධර්ම කොටස් ය. ධර්මයත් බුදුන් වහන්සේගේ රූපකාය සම්පත්තියත් එකවර වණන විද්‍යාචක්‍රවර්තීන් එයට උචිත භාෂා මාධ්‍ය හසුරුවා ගෙන ඇත. පුනරුක්ත පද භාවිතය ද ධර්ම දේශනා විලාසය ද ඒ සඳහා ගෙන ඇත. දෙවි බඹුන් පවා ආකාසය පුරා හිඳ බුදුන් වහන්සේගේ අසිරිමත් සිරි නරඹමින් තුටු වී යැයි දක්වන කතුවරයා නිර්මාණවාදීන්ට එල්ල කරන්නේ බලවත් පහරකි. බෞද්ධයන්ට දනවන්නේ බලවත් ශ්‍රද්ධා භක්තියකි. එතරම් එහි බස හා වර්ණනා හරවත් ය.

බුදුන් වහන්සේගේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණ වර්ණනා කරන කතුවරයා කෙටි වැකි, දිගු වැකි, අලංකාර මෙන් ම වෘත්තය රැකි බසක් යොදා ගෙන ඇත. ගුරුළුගෝමීන්ට වඩා හාත්පස වර්ණනා කරන කතුවරයා එවැනි මහාපුරිස ලක්ෂණයන් උරුම වීමට සසරෙහි පුරන ලද බෝධි සම්භාර ධර්මයන් ද සිහිපත් කරමින්, එමගින් ද පාඨකයා තුළ තව තවත් ශ්‍රද්ධා භක්තිය වඩවාල යි.

> "තවද ඒ සර්වඥයන් වහන්සේ ඇස් නිල් වුවමනා තැන්හි නිල්වෙයි. රන්වන් වුවමනා තැන්හි රන් ගෙනැ. රත් වුවමනා තැන්හි රතැ. සුදු වුවමනා තන්හි සුදුයැ. ... සසර පමණින් යාචකයන්ගේ පෙර මග බල බලා දල්වා ගෙනැ හිඳැ නො වහළ....තවද ඒ සර්වඥයන් වහන්සේ දෙ බැම අතුරෙහි උන් වහන්සේගේ රූප නැමති සාගරයෙහි දරණ වටා හොත් හැළි නාග රාජයක් හු බඳු වූ නළල් නැමති රන් මෙරගල් බිත්තියෙහි පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක් බඳු වූ ..."[61]

අලංකාරයට බර වූ ලයාන්විත වූ කාව්‍යාත්මක බස් වහර යොදා ගනිමින් කතුවරයා බුදුරුව වනා පාඨකයාට එම අසිරියෙහි සිරි කියා දී ඔවුනගේ හදවත් තුළ ශ්‍රද්ධා භක්තිය ජනිත කළ අයුරුයි ඒ.

බුදුන් වහන්සේ තව්තිසා වැඩ විජම් දෙසා මිනිස් ලොවට වඩින අවස්ථාව වණනා කතුවරයා පාඨකයා තුළ වඩ වඩාත් බුද්ධාලම්බන ප්‍රීතිය උපදවන සුලු කාව්‍යාත්මක භාෂාවක් යොදා ගනියි.

> "මැදෑ සත් රුවන් හිණින් බස්නා ස්වාමි දරුවාණන් හා වඩනා ඒ ශ්‍රී නො බුදු වැ කවුරු සිතා නිමවා ගනිත් ද ? ... ඒ බුද්ධ ශ්‍රී බලන සත්වයන් කෙරෙන් ඇසක් පියා ලූ එක ද සත්වයෙක් නැත. හිණි පෙත්තෙන් හිණි පෙත්තට ඒ ශ්‍රී පාදය බුද්ධ විලාසයෙන් ඔබ ඔබා නගා ලූ ශ්‍රී පාදයෙහි අටතුරා සියක් මගුල් ලක්ෂණ අනන්තාපරිමාණ සක්වලැ සත්වයනට පාමින් නික්මුණ හ."[62]

බුදුන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ ශෝභාමත් ස්වභාවය වනමින් දෙව් බඹ මිනිසුන්ගෙන් ලත් පූජෝපහාරයන් පිළිබඳ ඉතා චමත්කාර ජනක වර්ණනයක් ඉදිරිපත් කොට ඇත. බුදුන් වහන්සේ තව්තිසා වඩන ගමනේ දී පෑ යමාමහ පෙළහරේ ඓශ්වර්යය ද කතුවරයා පුනරුක්ත පද භාවිතයෙන් මෙන් ම ලඟ ලඟ තැබූ විරාම ලක්ෂණයෙන් ද කාව්‍යාත්මක කොට වනා ඇති අයුරු කාගේ වුව ද සිතට නගන්නේ බුදුන් වහන්සේගේ වික්‍රමයෙන් විස්මයට පත් සිතුවිලි සමුදායකි. ඒ සිතුවිලි සමුදාය සමග උපදවන ගෞරව සහිත භක්තියකි, ශ්‍රද්ධාවකි.

නාලාගිරි දමන කතාවේ දි බුදුන් වහන්සේත් නාලාගිරි ඇතාත් අභිමුඛ වීමේ අවස්ථාව ඉතාමත් උද්වේග කර අයුරෙන් ද, හස්තියාගේ චණ්ඩ ස්වරූපය දනවන අයුරෙන් ද, බුදුන් වහන්සේගේ මෙත් කරුණා මුදිතා දී ගුණ පෙරට එන අයුරෙන් ද, එක් ම ඡේදයකින් වනා දක්වන අයුරු ප්‍රශස්ත ය. එකපිට එක වැටෙන වාක්‍යාංශ යොදා ගැනීමත් උපමාලංකාරයත් නිසා එහි කාව්‍යාත්මක ගුණය නිතැතින් ම රැඳුනේ වන.

> "ඈත ධූලින් වැසී ගිය ඇත් රජුයැ. මෑත සවනක් ගණ බදුරසින් සැදීගිය බුදුරජාණෝ යැ. ඈත කෝපයෙන් රත් ව ගියැ යවට වැනි ඇස් ඇති ඇත්රජයැ. මෑත කරුණායෙන් තෙත් ව ගිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදු රජාණෝ ය. ඈත එබූ එබූ පයින් මහ පොළොව පළා පියන්නා සේ දිවෙන ඇත් රජ ය. මෑත එබූ එබූ පයින් මිහිකත සනහ සනහා වඩනා බුදු රජාණෝ යැ. ඈත බැලූ බැලූවන් අනේ අනේ යි කියවන ඇත් රජාණෝ යැ. මෑත බැලූ බැලූවන් සාධු සාධු'යි කියවන බුදුරජාණෝ යැ."[63]

පුනරුක්ත පද යොදා ගනිමින් බුදුන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණාංගයන් ද රූප සම්පත්තිය ද ඍද්ධි ප්‍රාතිහාර්ය බලය ද එක් ම පාඨයකට ගොණුකොට කවි බසින් තෙදවත් කොට වණනා වැනුමෙහි අසිරිය කුමට පැහැදිලි ද.

ආලවක, නාලාගිරි ආදි දමන කතා තුළ නිතැතින් ම භාවෝද්දීපන අවස්ථාවෙන් පටන් ගත් සිද්ධි වර්ණනා හමු වේ. උපමා කාණ්ඩයෙන් කොතෙකුත් උපමා හමු වේ. උපමාලංකාර යොදා ගැනීමේ දි කතුවරයා උපමා, උපමා වැල් හා මාලෝපමා යොදා ගෙන ඇති සැටියක් දක ගත හැකි

ය. නාලාගිරි දමන කතාවේ දී එවැනි මාලෝපමා මගින් බුදුන් වහන්සේගේ අසිරිය වැනූ තැනක් හමු වේ.

> "ළහිරු මඬලක් සේ ද ස්වාමි දරුවාණෝ ගඳ කිළියෙන් නික් ම ගත් හ. නික් ම ගත් සඳමැ සඟ මහළු පිළිවෙලින් බුදුරුවන් පළමු කොටැලා සඟරුවන් පෙළන් වඩනට වන් සේකැ. නායක මාණික්‍ය රත්නය අනුකොට ගොතා හෙලා ලූ රුවන් වැලක් වැන්නයි නො කියමි. සොළොස් කලාවෙන් පිරුණු සඳ මඬල ඉදිරියෙහි තබා පස්සෙහි පෙළ හෙළ පිහිටුවා ලූ තරු වැලක් වැන්නයි නො කියමි. .... මේ උපමා කියා ඒ බුද්ධ විලාසයට නින්දා නො කෙරෙමි මාගේ ස්වාමි දරුවාණෝ තුමූ මැ තමන් වැන්නා හ."[64]

තමන් යොදන උපමා සුදුසු මදිදෝ යි සිතන කතුවරයා එවැනි උපමා සොයා යාමෙන් වැඩක් නැතැයි සිතා බුදුන් වහන්සේ බුදුන් වහන්සේට ම උපමා කොට දක්වී ය. කාව්‍යාත්මක රීතියේ විශේෂතාවක් වන උපමා භාවිතයෙන් කතුවරයා බුදු ගුණ වනා පාඨකයා තුළ ශ්‍රද්ධා භක්තිය ජනිත කොට ඇති අයුරු ප්‍රශස්ත ය. බුත්සරණේ පැණෙන උපමා කාණ්ඩය ම ඒ සඳහා නිදසුන් වශයෙන් ගත හැකි ය .

බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනිත කරවීමෙහිලා බුත්සරණ කතුවරයා කාව්‍යාත්මක භාෂාවක් යොදා ගත් තවත් ප්‍රයෝගයක් ලෙසින් ගුණ වාචක පද භාවිතය හැඳින් වීමට පුළුවන. ගුණ වාචක පද දක්වීමේ දි කතුවරයා සකුවට බර තත්සම පද භාවිත කොට ඇත.

> "ඉක්බිති ලෝකාචාර්ය වූ, අනාචාර්ය වූ, ධර්ම චක්‍රවර්තී වූ, ධර්මධ්වජ වූ, ත්‍රිභුවන චූඩාමාණික්‍ය වූ, දශබලධාරී වූ, චතුර්වෛශාරද්‍ය විශාරද වූ, අසමසම වූ, අප්‍රති පුද්ගල වූ, ආශ්චර්ය නිධාන වූ සමන්ත භද්‍ර වූ, අකුතෝභය වූ, ලෝකාලෝකදිවාකර වූ....."[65]

ඉහත දක් වූ උද්ධෘත පාඨ ගෙන බලන කල්හි කතුවරයා කාව්‍යාත්මක භාෂා උපයෝගිතා ව තුළින් අසන්නා හා පාඨකයා තුළ නිරන්තර බුදු බැතිය වඩවාලීමට ගත් ප්‍රශංසනාත්මක උත්සාහය දක ගැනීමට පුළුවන.

භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා කතුවරුන් දෙදෙනා ම යොදා ගත් භාෂාත්මක උපයෝගිතාව කෙබඳු ද යන්න ඉහත දක් වූ විචාරක අදහස් තුළින් හා උද්ධෘත පාඨයන්ගෙන් පැහැදිලිය. තම ග්‍රන්ථ විෂයත්, පාඨක පිරිසත්, වස්තු විෂයත් යන කරුණු සැලකිල්ලට ගනිමින් කතුවරුන් දෙදෙනා ම භක්ති කාව්‍ය සංවර්ණනයෙහිලා භාෂාවේ උපයෝගිතාව ප්‍රබල ව යොදාගෙන ඇති බව පෙනේ. විග්‍රහාත්මක ව විවිධ භාෂා ලක්ෂණයන්ගෙන් හැඩ ගැසුණු තත් ග්‍රන්ථ තුළ බුද්ධකාය සංවර්ණනාව ද, ධර්මකාය සංවර්ණනාව ද, ඍද්ධි ප්‍රාතිහාර්යමය සංවර්ණනාවද, ආධ්‍යාත්මක ගුණ සංවර්ණනාව ද මනා ව සිදු කරමින් පාඨකයා තුළ ශ්‍රද්ධාවත් භක්තියත් ජනිත

කරවී ය. ග්‍රන්ථ රචක යුගයේ ප්‍රචලිත භාෂා ව්‍යවහාරයන් ද ධර්ම දේශනා මාර්ගය ද උපයෝගි කරගෙන ඇති තත් භාෂා ප්‍රයෝගයන් තුළින් බුදුන් වහන්සේ දේවාති දේව, ශක්‍රාති ශක්‍ර, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ අයුරු කියා සිය දහස් සක්වල බුදුන් වහන්සේට වැඩි කෙනෙක් නැති බව පවසමින් ශ්‍රාවක පාඨක සිත් සතන් තුළ රංජනය කළා වූ භක්තිය හා ගෞරවය අති මහත් ය. භක්ති කාව්‍යමය ග්‍රන්ථයක් ලෙස ධර්මප්‍රදීපිකාවත්, අමාවතුරත්, බුත්සරණත් නම් කිරීමෙහිලා තත් කතුවරුනගේ භාෂාත්මක සාධකය ද බෙහෙවින් ඉවහල් වී ඇතැයි පවසතොත් එය නිවැරැදි ය. යුක්ති යුක්ත ය.

## ආන්තික සටහන්

---

1 බුත්සරණ. සංස් : ලබුගම ලංකානන්ද හිමි. 1965, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, පිටු අංක 12.
2 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය I, 1961, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පිටු අංක 184 - 185.
3 -එම-, පිටු අංක 192.
4 වික්‍රමසිංහ මාර්ටින්, සාහිත්‍යෝදය කතා හා සාහිත්‍යකලාව, 1991, තිසර ප්‍රකාශයෝ , පිටු අංක 24.
5 කුලසූරිය ආනන්ද ,සිංහල සාහිත්‍ය I, ,1999, විසිදුණු ප්‍රකාශකයෝ පිටු අංක 153- 154.
6 ධර්මප්‍රදීපිකාව, සංස්:- වී.ඩී.ඇස්. ගුණවර්ධන. 2001, සමයවර්ධන පොත්හල, කොළඹ, පිටු අංක 26.
7 -එම -, පිටු අංක 47.
8 සුරවීර ඒ. වී. , සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය, 1998, කුරුළු පොත් ප්‍රකාශකයෝ, පිටු අංක 94.
9 අමාවතුර - සංස්: වැලිවිටියේ සෝරත හිමි, 2000, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ , පිටු අංක 106 .
10 -එම-, පිටු අංක 116.
11 -එම-, පිටු අංක 05.
12 -එම-, පිටු අංක 12.
13 වික්‍රමසිංහ මාර්ටින් , සිංහල සාහිත්‍යයේ නැගීම, 1964, සමන් මුද්‍රණාලය, මහරගම, පිටු අංක 119.
14 වික්‍රමසිංහ මාර්ටින්, සාහිත්‍යෝදය කතා හා සාහිත්‍යකලාව, 1995, තිසර ප්‍රකාශකයෝ,දෙහිවල, පිටු අංක 28.
15 බුත්සරණ, සංස් :- ලබුගම ලංකානන්ද හිමි, 1965, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, පිටු අංක 54.
16 -එම-, පිටු අංක 161 -162.
17 -එම-, පිටු අංක 226.
18 වික්‍රමසිංහ මාර්ටින් , සාහිත්‍යෝදය කතා හා සාහිත්‍ය කලාව, 1991, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල පිටු අංක 24.
19 කුලසූරිය ආනන්ද ,සිංහල සාහිත්‍ය I, 1961, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පිටු අංක 153.
20 ධර්මප්‍රදීපිකාව, සංස්:- වී. ඩී. එස්.ගුණවර්ධන, 2001, සමය වර්ධන ප්‍රකාශන, කොළඹ, පිටු අංක 16-17.
21 -එම-, පිටු අංක 01.
22 -එම-, පිටු අංක 15.
23 -එම-, පිටු අංක 05.
24 -එම-, පිටු අංක 20.
25 -එම -, පිටු අංක 237.
26 සන්නස්ගල පී. බී. , සිංහල සාහිත්‍ය වංශය, 1961, ලේක් හවුස් මුද්‍රණාලය, කොළඹ, පිටු අංක 108.
27 වික්‍රමසිංහ කේ. ඩී. පී, සිංහල ලේඛක පරපුර, 1964, ඇම් ඩී. ගුණසේන සහ සමාගම, පිටු අංක 116.
28 වික්‍රමසිංහ මාර්ටින් , සිංහල සාහිත්‍යයේ නැගීම, 1964, සමන් මුද්‍රණාලය, මහරගම, පිටු අංක 67.
29 අමාවතුර, සංස්:-වැලිවිටියේ සෝරත හිමි, 2000, ප්‍රකා:-එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, සංඥාපනය, පිටු අංක 07.
30 -එම-, පිටු අංක 91.
31 -එම-, පිටු අංක 164-165.
32 -එම-, පිටු අංක 169.
33 සාරථී. ප්‍රකාශනය, මධ්‍යම පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය, 1992, මංගල කලාපය, පියසිලි විජේමාන්න, පිටු අංක 96.
34 කුලසූරිය ආනන්ද ,සිංහල සාහිත්‍ය 01, 1961, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පිටු අංක 192.
35 -එම-, පිටු අංක 96.
36 බුත්සරණ. සංස් : ලබුගම ලංකානන්ද හිමි. 1965, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, පිටු අංක 12-13.
37 -එම-, පිටු අංක 348.
38 වික්‍රමසිංහ කේ. ඩී. පී, සිංහල ලේඛක පරපුර, 1964, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, පිටු අංක 106.
39 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය I, 1961, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පිටු අංක 152.
40 ධර්මප්‍රදීපිකාව, සංස්:- වී. ඩී. එස්.ගුණවර්ධන, 2001, සමය වර්ධන ප්‍රකාශන, කොළඹ, පිටු අංක 22-23.
41 -එම-, පිටු අංක 10.
42 -එම-, පිටු අංක 07.
43 -එම-, පිටු අංක 10.
44 -එම-, පිටු අංක 20
45 -එම-, පිටු අංක 34.
46 -එම-, පිටු අංක 40.
47 -එම-, පිටු අංක 167.
48 වික්‍රමසිංහ මාර්ටින්, සාහිත්‍යෝදය කතා හා සාහිත්‍යකලාව, 1991, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, පිටු අංක 23.

49 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය I, 1961, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පිටු අංක 158.
50 වජිරඥාන හිමි හොරණ, සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා, , 1992, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පිටු අංක 100.
51 අමාවතුර, සංස්:-වැලිවිටියේ සෝරත හිමි, 2000, ප්‍රකා:-එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පිටු අංක 17.
52 -එම-, පිටු අංක 111-112.
53 -එම-, පිටු අංක 163.
54 වික්‍රමසිංහ මාර්ටින්, සාහිත්‍යෝදය කතා හා සාහිත්‍යකලාව, 1991, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, පිටු අංක 27-28.
55 කුලසූරිය ආනන්ද,සිංහල සාහිත්‍ය I, 1999, විසිදුණු ප්‍රකාශකයෝ , පිටු අංක 192, 201.
56 වික්‍රමසිංහ කේ.ඩී.පී,සිංහල ලේඛක පරපුර, 1964, ගුණසේන සහ සමාගම, පිටු අංක 123-124.
57 සන්නස්ගල පී.බී, සිංහල සාහිත්‍ය වංශය, 1961, ලේක් හවුස් මුද්‍රණාලය, කොළඹ, පිටු අංක 143.
58 බුත්සරණ, සංස්: සිරි තිලකසිරි, ප්‍රේමදාස මනම්පේරි, 1999, රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන, පිටු අංක 15-16. (ප්‍රස්තාවනා)
59 බුත්සරණ, සංස්: ලංකානන්ද හිමි, ලබුගම, 1968, ප්‍රකා:-ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, පිටු අංක 79.
60 -එම-, පිටු අංක 106.
61 -එම-, පිටු අංක 257-258.
62 -එම-, පිටු අංක 116.
63 -එම-, පිටු අංක 82.
64 -එම-, පිටු අංක 78-79.
65 -එම-, පිටු අංක 105.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කනංගමුවේ රාහුල හිමි
අංශ ප්‍රධාන,
භාෂා අධ්‍යයන අංශය,
භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුර.